# 2014

# වාර්ෂික වාර්තාව
# ஆண்டறிக்கை
# Annual Report

රජයේ මුද්‍රණ නීතිගත සංස්ථාව
அரசாங்க அச்சகக் கூட்டுத்தாபனம்
State Printing Corporation

රජයේ මුද්‍රණ නීතිගත සංස්ථාව

அரசாங்க அச்சகக் கூட்டுத்தாபனம்

STATE PRINTING CORPORATION

**වාර්ෂික වාර්තාව, ගිණුම් ප්‍රකාශන සහ විගණකාධිපතිගේ වාර්තාව**

# රජයේ මුද්‍රණ නීතිගත සංස්ථාව

# 2014

# වාර්ෂික වාර්තාව

**2014 දෙසැම්බර් මස 31 දිනෙන් අවසන් වූ 47 වෙනි වසර සඳහා**

**2014 ජනවාරි මස 01 වෙනි දින සිට**

**2014 දෙසැම්බර් 31 වෙනි වෙනි දින දක්වා**

# දැක්ම

මුද්‍රණ කර්මාන්තයේ ප්‍රමුඛයාවීම සමගින්
ප්‍රකාශනයෙන් විශේෂයෙන්
අධ්‍යාපන සංවර්ධන ප්‍රකාශනයෙන්,
සුරක්‍ෂා මුද්‍රණ කර්මාන්තය,
අභ්‍යාස පොත් හා ලිපිද්‍රව්‍ය
නිෂ්පාදන වෙළඳපොලේ පුරෝගාමියා වීම.

# මෙහෙවර

දක්‍ෂ, නිපුණ, ධෛර්යමත් හා තෘප්තිමත්
සේවක මණ්ඩලයකින් සමන්විත
ආදර්ශමත් රාජ්‍ය සංස්ථාවක් ලෙස
මුද්‍රණ කර්මාන්තයේ උසස්ම ප්‍රමිතියට අනුව
තරඟකාරී මිලකට මුද්‍රිත නිෂ්පාදන
ජනතාවගේ අවශ්‍යතාවය හා උන්නතිය සඳහා
සැපයීමට කැපවෙනු ඇත.

පානළුව,
පාදුක්ක.

ගරු පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ හා ජනමාධ්‍ය අමාත්‍යතුමා
පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ හා ජනමාධ්‍ය අමාත්‍යාංශය
අංක 163, කිරුළපන මාවත
කොළඹ 05.

ගරු ඇමතිතුමනි,

1971 අංක 38 දරන මුදල් පනතේ 14 වෙනි වගන්තියේ කොන්දේසිවලට අනුකූලව අධ්‍යක්ෂ මණ්ඩලය වෙනුවෙන් 2014 දෙසැම්බර් 31 දින දක්වා වූ කාල පරිච්ඡේදය ආවරණය කෙරෙන,

01. රජයේ මුද්‍රණ නීතිගත සංස්ථාවේ කටයුතු පිළිබඳ වාර්ෂික වාර්තාව

02. ගණන් පරීක්ෂණයට භාජනය කරන ලද මූල්‍ය තත්වය පිළිබඳ ප්‍රකාශණය හා විස්තීරණ ආදායම් ප්‍රකාශය ඇතුළු මූල්‍ය ප්‍රකාශණ

03. විගණකාධිපතිවරයාගේ අදහස් දැක්වීම

ඔබතුමාගේ දැන ගැනීම සඳහා මේ සමග ඉදිරිපත් කරමි.

මෙයට - විශ්වාසී
රවින්ද්‍ර යසලාල් කලන්සූරිය
සභාපති
රජයේ මුද්‍රණ නීතිගත සංස්ථාව

# සභාපතිතුමාගේ පණිවුඩය



ආසියාව තුළ මුද්‍රණ කර්මාන්තයේ දැවැන්තයා ලෙස ජන්මලාභය ලැබ 1968 වර්ෂයේ සිට මොහොතින් මොහොත පෙරමග තුළ ජයග්‍රහණය ලබමින් වර්ෂ 46ක කාල පරාසය තුළ සියලු බාධක පරයමින් පැමිණි ගමන්මග දෙස විමසා බැලීමේදී නිමා වූ තවත් කෙටි කාල පරාසයක් වෙනුවෙන් සැකසෙන 2014 වර්ෂයේ වාර්ෂික වාර්තාව හා ගිණුම් ලාභදායීත්වය මෙන්ම කාර්යක්ෂමතාව හා අරමුණු තවදුරටත් ආරක්ෂා කර ගනිමින් ලාංකීය සමාජය හමුවේ තැබීමට හැකිවීම පිළිබඳ මා සතුටට පත්වෙමි.

යහපාලනය පෙරදැරි කරගනිමින් සම්මුතිවාදී පාලනයක් දැයට දායාද කළ අතිගරු ජනාධිපතිතුමා ප්‍රමුඛ අභිනව රාජ්‍ය පාලනයේ සාර්ථක ගමන සඳහා අපට දායකත්වය සැපයීමට හැකිවීම අපගේ මෙන්ම දේශයේ ඉදිරි ගමනට අත්වැලක් වනු නොඅනුමානය. එමෙන්ම පසුගිය කාලය තුළ පසුබෑමට ලක් වූ අප, වෙළඳපළ තුළ නැවත ස්ථාන ගත වෙමින් අතිප්‍රමාණික ලාභ සංකල්පයෙන් බැහැර පූර්ණ තරගකාරී වෙළඳපළ තුළ ප්‍රමාණික ලාභ සංකල්පය හරහා වැඩි ව්‍යාපාරික අවස්ථා උදාකර ගනිමින් ආයතනයේ මූල්‍ය ප්‍රතිලාභයන් තව තවත් වර්ධනය කරමින් මෙතෙක් පවත්වා ගෙන ආ ක්‍රමවේදය වඩාත් වේගයෙන් පෙරට ගෙන යාමට අත්පොත් තැබූ මොහොතක සමාජයේ යහපත උදෙසා විනිවිද දකින පරිදි පසුගිය කාල පරාසය වෙනුවෙන් සංස්ථාවේ ගමන් මග හෙළි කරන වාර්ෂික විශ්ලේෂණය ඉදිරිපත් වීමද සතුටකි.

අතීතයේ පැවති විවිධ හැලහැප්පීම් බාධක පරයමින් තරගකාරී වෙළඳපළ තුළ හුදකලා වූ තැන් නිවැරදි කරමින් ආසියාවේ දැවැන්තයා ලෙස ළද විරුදාවලිය අනාගතය වෙනුවෙන් ආරක්ෂා කරමින් ශක්තිමත් දැවැන්තයෙකු බිහිකරන සිහිනයක් සහිත ගමනක් සඳහා පියවර ක්‍රියාත්මක මොහොතක එම ගමන් මග සාර්ථක කරන්නට යුගයේ විශිෂ්ට මෙහෙවර වෙනුවෙන් කැපවූ යහපාලන සම්මුතිවාදී රාජ්‍ය පාලනයේ ප්‍රධාන මෙහෙයුම්කරුවන් වන අතිගරු ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මැතිතුමා හා ගරු අග්‍රාමාත්‍ය රනිල් වික්‍රමසිංහ මැතිතුමා ආදරයෙන් ගෞරවයෙන් සිහිපත් කරමි. එසේම එතුමන්ගේ සෙවණ හා ආශීර්වාදය තුළින් අප ගමන් මග එළි පෙහෙළි කරන්නට නිතිපතා දායකත්වය සපයමින් අප නිසි මගට යොමු කළ ගරු පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ හා ජනමාධ්‍ය අමාත්‍ය ගයන්ත කරුණාතිලක මැතිතුමා හා නියෝජ්‍ය අමාත්‍ය කරුණාරත්න පරණවිතාන මැතිතුමා ද කෘතඥතා පූර්වකව සිහිපත් කරමි.

ආයතනයේ ක්‍රියාකාරකම් අධීක්ෂණය කරමින් යා යුතු නිවැරදි දිසාව තෝරා බේරා දෙමින් අප කෙරේ විශ්වාසයෙන් කටයුතු කරන අමාත්‍යාංශ ලේකම් නිමල් බෝපගේ මැතිතුමා සහ අප සංස්ථාවේ අධ්‍යක්ෂ මණ්ඩලය හෙට දින ගොඩනගන්නට මා වෙත ලබාදෙන ශක්තිය ද ගෞරවයෙන් සිහිපත් කරන අතර, ආසියාවේ දැවැන්තයාගේ ගමන් මගට ශක්තිය දෙමින් සාමූහික හැඟීමෙන් අත්වැල් ගැටගසා ශක්තිමත් අත්වැලක් තනා ඇති සංස්ථාවේ සමස්ත සේවක මඬුල්ල ද කෘතඥතා පූර්වකව සිහිපත් කරමි.

රවින්ද්‍ර යසලාල් කලංසූරිය
සභාපති
රජයේ මුද්‍රණ නීතිගත සංස්ථාව.

# 2014

## අධ්‍යක්ෂ මණ්ඩලය

**සභාපති**

ජයම්පති බණ්ඩාර හීන්කෙන්ද මහතා (2014. 06. 30 දක්වා)

පී. ජී. දසනායක මහතා (2014. 07. 15 දින සිට)

**උප සභාපති**

එච්. කේ. ඩී. ලක්ෂ්මන් ගාමිණී මහතා

**අධ්‍යක්ෂ**

1. අමරපාල ගමගේ මහතා
2. ඩී. ජී. එන්. කුමාරි මිය (2014. 07. 17 දක්වා)
3. එන්. එච්. එම්. චිත්‍රානන්ද මහතා
4. නන්දසිරි කළුබෝවිල මහතා
5. රාජනී අතපත්තු මිය
6. එච්. සී. ඩී එල්. සිල්වා මහතා<br>(2014. 09. 22 දින සිට)

# 2014

## විධායක නිලධාරී මණ්ඩලය

**සාමාන්‍යාධිකාරී**
ආර්. එම්. එන්. මොණරවිල මහතා

**මුදල් කළමනාකරු**
එන්. ඩී. ප්‍රියංකර කුමාර මහතා

**වැඩ කළමනාකරු**
එස්. ටී. කරුණාරත්න මහතා

**සැපයුම් කළමනාකරු**
ඊ. වී. කේ. කීර්තිරත්න මහතා

**කළමනාකරු (පරිපාලන හා මානව සම්පත් සංවර්ධන)**
ආර්. එම්. යූ. බී. බණ්ඩාර මහතා

**අලෙවි කළමනාකරු**
එම්. ටී. ජේ. පෙරේරා මහතා

**කළමනාකරු (මෙහෙයුම්)**
එල්. පී. හේවාවිතාරණ මහතා

**නියෝජ්‍ය වැඩ කළමනාකරු**
ටී. එම්. ආර්. එන්. තෙන්නකෝන් මහතා

**නියෝජ්‍ය වැඩ කළමනාකරු**
ඩී. එම්. එම්. බී. දිසානායක මහතා

**නියෝජ්‍ය මුදල් කළමනාකරු**
කේ. එච්. තිලකරත්න මහතා

**කළමනාකරු (ලිපි ද්‍රව්‍ය කර්මාන්ත ශාලාව)**
එල්. ටී. ප්‍රේමසිරි මහතා

**ගණකාධිකාරී**
එම්. ආර්. පී. ජයවර්ධන මහතා

**ගණකාධිකාරී**
ඩබ්. එල්. දෙනියගේ මහතා

**අභ්‍යන්තර විගණක**
ඒ. එස්. සී. සිල්වා මහතා

**සහකාර කළමනාකරු වැඩ (ඇස්තමේන්තු)**
කේ. ඩී. ටී. චන්ද්‍රසිරි මහතා

**සහකාර කළමනාකරු වැඩ (සුරක්ෂා)**
එම්. ඒ. කොතලාවල මහතා

**සහකාර කළමනාකරු වැඩ (ප්‍රොසෙස්)**
එස්. ඩී. කුමාරසිංහ මහතා

**සහකාර කළමනාකරු වැඩ (පොත් බැඳීම්)**
එම්. ඒ. ශාන්ත කුමාර මහතා

**සහකාර කළමනාකරු වැඩ (නඩත්තු)**
කේ. ඒ. ඒ. ඩී. ජූඩ් පීටර් මහතා

**සහකාර කළමනාකරු වැඩ (ලිතෝ)**
පී. කේ. තිලක් මහින්ද මහතා

**සහකාර කළමනාකරු (විකුණුම්)**
එච්. ආර්. ගුණසේකර මහතා

**සහකාර කළමනාකරු (ආරක්ෂක)**
ඩබ්. ඩබ්. එම්. ආරච්චිගේ මහතා

**සහකාර කළමනාකරු**
**(පරිපාලන හා මානව සම්පත් සංවර්ධන)**
කේ. එච්. බී. සජීව මහතා

**ආයතන කළමනාකරු (කොන්ත්‍රාත්)**
ඩී. එම්. එච්. වයි. දිසානායක මහතා

# 2014 | අධ්‍යක්ෂ මණ්ඩලයේ වාර්තාව

1971 අංක 38 දරන මුදල් පනතේ 14 වන වගන්තියේ කොන්දේසි ප්‍රකාරව 2014 දෙසැම්බර් 31 වෙනි දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා සංස්ථාවේ ක්‍රියාත්මක වූ වැඩ පිළිවෙළ ඇතුළත් සිය 47 වෙනි වාර්තාව රජයේ මුද්‍රණ නීතිගත සංස්ථාවේ අධ්‍යක්ෂ මණ්ඩලය සතුටින් මෙසේ ඉදිරිපත් කරයි.

**සමාලෝචිත කාල පරිච්ඡේදය තුළ අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් 11 ක් පවත්වන ලදී.**

## 01. නිෂ්පාදනය

### 1.1 පාසල් පෙළ පොත්

### 1.1.1 පාසල් පෙළ පොත් මුද්‍රණය

පාසල් පෙළ පොත් මුද්‍රණය මූලික අරමුණ කර ගනිමින් පිහිටුවනු ලැබූ සංස්ථාව විවෘත ආර්ථිකය හඳුන්වා දීමත් සමගම වෙනත් නිෂ්පාදන අංශ කරා යොමුවී ඇත. ඒ සමගම පාසල් පොත් මුද්‍රණය සෘජුව සංස්ථාව වෙත පැවරීම වෙනුවට ටෙන්ඩර් මගින් තරගකාරීව අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුවේ ඇණවුම් ලබා ගැනීමට සංස්ථාවට සිදුවිය. එහෙත් එම ක්‍රමය වෙනස් කරමින් 2014 වර්ෂයේදී ද ටෙන්ඩර් පටිපාටියෙන් පරිබාහිරව පෙළ පොත් මුද්‍රණය සංස්ථාවට පැවරීමට කැබිනට් අනුමැතිය ලැබිණි. ඒ අනුව 2014 වසරේදී ද පාසල් පෙළ පොත් පිටපත් මිලියන 8.4 ක් මුද්‍රණය කර දෙමින් සංස්ථාවට රු. මිලියන 789,897 ක ආදායමක් ලැබුණි.

සමාලෝචිත වර්ෂයේ මුද්‍රණය කළ පාසල් පෙළ පොත් පිටපත් සංඛ්‍යාව හා ඉන් ලද ආදායම 2012 හා 2013 ට සාපේක්ෂව පහත දැක්වේ.




| පාසල් මුද්‍රණ වැඩ | 2012 ('000) | 2013 ('000) | 2014 ('000) |
|---|---|---|---|
| පිටපත් සංඛ්‍යාව | 7,905 | 8,546 | 8,406 |
| ආදායම - රු. | 666,223 | 758,335 | 789,897 |




### 1.2 වෙනත් මුද්‍රණ සේවා

සමාලෝචිත වර්ෂය තුළදී දහම් පාසල් පොත් මුද්‍රණය, ආරක්ෂිත මුද්‍රණ සේවා (ලොතරැයිපත්, රිදී රේඛා, බැංකු තැන්පත් සහතික පත්, තැපැල් පාස්පොත්, ලේබල්, එයාපෝර්ට් සුපර් බ්‍රෝ යනාදිය) සහ රාජ්‍ය ආයතන සඳහා මුද්‍රණ සේවා සපයන ලදී. එමෙන්ම විවිධ ආයතන සඳහා දිනපොත්, කැලැන්ඩර් යනාදිය මුද්‍රණය කරන ලදී. මීට අමතරව විවිධ ආයතනවල මුද්‍රණ කාර්යයන් ද ඉටු කරන ලදී. විශේෂ මුද්‍රණ සේවා කිහිපයක් පහත පරිදි වේ.




### 1.2.1 සුරක්ෂා මුද්‍රණ සේවා

ජාතික ලොතරැයි මණ්ඩලය සඳහා මහජන සම්පත ලොතරැයිය ද දැනට වසර 40 ක පමණ කාලයක් මුද්‍රණය කරනු ලැබේ. මීට අමතරව පවර් ලොටෝ සහ එයාර්පෝට් ලොතරැයියද මුද්‍රණය කරනු ලැබේ. ලොතරැයි මණ්ඩලයෙන් ලද සියලුම ඇණවුම් මුද්‍රණය කරදුන් අතර 2014 වසරේදී මුද්‍රණය වූ ලොතරැයි ප්‍රමාණය මිලියන 245කි. ඒ අනුව ආදායම රු. මිලියන 137 ක් වී ඇත. ලොතරැයි මුද්‍රණයේ ආදායම හා පිටපත් සංඛ්‍යාව පහත සඳහන් පරිදි වේ.




| ලොතරැයි මුද්‍රණ වැඩ | 2012 ('000) | 2013 ('000) | 2014 ('000) |
|---|---|---|---|
| පිටපත් සංඛ්‍යාව | 256,195 | 242,991 | 244,655 |
| ආදායම - රු. | 145,701 | 136,124 | 137,007 |

### 1.2.2 වෙනත් මුද්‍රණ සේවා

රජයේ අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු සඳහා මෙන්ම පෞද්ගලික අංශයේ ඇණවුම් ලබා ගැනීම කෙරෙහි විශේෂ උනන්දුවකින් ක්‍රියා කරන ලදී. ඉටු කරන ලද විශේෂ මුද්‍රණ සේවා අතර පහත සඳහන් සේවා ප්‍රධාන තැනක් ගන්නා ලදී.

01. විවිධ ආයතනයන් සඳහා වූ වාර්ෂික වාර්තා
02. රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාව සඳහා වූ විවිධ මුද්‍රණ වැඩ කටයුතු
03. විශ්ව විද්‍යාල සහතික පත්
04. ජාතික සත්වෝද්‍යානයට අයත් ප්‍රවේශ පත්‍ර හා අනෙකුත් විස්තර පත්‍රිකා
05. සිනමාශාලා ටිකට්පත්
06. සේවක අර්ථසාධක අරමුදලේ විවිධ මුද්‍රණ වැඩ
07. ජාතික ඉතිරි කිරීමේ බැංකුවට අයත් මුද්‍රණ කටයුතු (රිදී රේඛා සහතික පත්)
08. විභාග දෙපාර්තමේන්තුව සඳහා මුද්‍රණය කරන ලද උත්තර ලියන කඩදාසි පොත්
09. ජන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුවට අයත් මුද්‍රණ කටයුතු

සමාලෝචිත වර්ෂයේදී විවිධ මුද්‍රණ වැඩ ඉටු කරමින් සංස්ථාව ලත් ආදායම රු. මිලියන 391 කි.

## 1.3 අභ්‍යාස පොත් සහ අනෙකුත් පොත් නිෂ්පාදනය

සමාලෝචිත වර්ෂයට සාපේක්ෂව 2012 හා 2013 වසරවල නිෂ්පාදනය පහත පරිදි වේ.

| අභ්‍යාස පොත් හා අනෙකුත් පොත් | 2012 රු.('000) | 2013 රු.('000) | 2014 රු.('000) |
|---|---|---|---|
| පොත් පිටපත් සංඛ්‍යාව | 10,571 | 10,141 | 8,615 |
| ආදායම - රු. | 234,824 | 228,563 | 204,210 |

අභ්‍යාස පොත් සඳහා අවශ්‍ය ලියන කඩදාසි නියමිත පරිදි නොලැබීම නිසා 2014 වසර සඳහා ලබාදී තිබූ නිෂ්පාදන ඉලක්ක සපුරා ගැනීමට නොහැකි විය.







# 02. අලෙවි හා විකුණුම්

පෙර වර්ෂයේ සමස්ත ආදායමට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ ආදායම රු. 14,866,494.00 කින් වර්ධනය වී ඇත.

| | 2012 රු.('000) | 2013 රු.('000) | 2014 රු.('000) |
|---|---|---|---|
| සමස්ත අලෙවිය | 239,075 | 235,593 | 250,459 |

ආදායම ප්‍රධාන ප්‍රභවයන් 03ක් ඔස්සේ ලැබෙන අතර පෙර වසරේ තත්ත්වය හා සංසන්දනයේ සාරාංශය පහත පරිදි වේ.

| ආදායම් ප්‍රභවය | 2013 රු. | 2014 රු. | වෙනස |
|---|---|---|---|
| සංස්ථා ලිපිද්‍රව්‍ය | 211,757,807 | 231,584,796 | 19,826,989 |
| ප්‍රකාශන | 168,676 | 218,382 | 49,706 |
| වෙනත් ලිපිද්‍රව්‍ය | 23,666,684 | 18,656,316 | (5,010,368) |

සංස්ථා ලිපිද්‍රව්‍ය අලෙවිය 9.36%කින් වර්ධනයක් පෙන්වා ඇත. වෙනත් ලිපිද්‍රව්‍ය අලෙවි වටිනාකම 21%කින් අඩුවී ඇත.

වෙනත් ලිපිද්‍රව්‍ය විවෘත වෙළඳපොළෙන් මිලදී ගෙන නැවත විකිණීමට යොමු කරන අතර එම අයිතම ප්‍රසම්පාදනය ඉතා දුර්වල තත්ත්වයක පැවතීම නිසා ළඟාකර ගත හැකිව තිබූ විශාල අලෙවි ආදායමක් අහිමිවී ඇත.

සංස්ථා ලිපිද්‍රව්‍ය අලෙවි ආදායම සැලකිය යුතු ලෙස වර්ධනයක් පෙන්වා ඇතත් වසර පුරාවටම අමුද්‍රව්‍ය මුද්‍රණ කඩදාසි ප්‍රසම්පාදනයේ දී ඇතිවූ ගැටළු නිසා නිෂ්පාදන ධාරිතාවයට අනුව




ලිපිද්‍රව්‍ය නිෂ්පාදනය නොවීම නිසා විශාල ඇණවුම් ප්‍රමාණයක් අහිමි වූ අතර ලබාගත හැකිව තිබූ විශාල අලෙවි ආදායමක් අහිමිවී ඇත. එසේ නොවන්නට වඩාත් හොඳ ප්‍රතිඵලයක් ලැබීමට තිබුණි.

## 03. ස්ථාවර වත්කම්

2014 වර්ෂය අවසානයේදී සංස්ථාව සතු ස්ථාවර වත්කම්වල මුළු පිරිවැය රු. 375,101,361/= ක් විය. එහි ශුද්ධ වටිනාකම රු. 93,143,947/= කි. මෙම තත්ත්වය මීට පෙර, එනම් 2013 වසර හා සැසඳීමේදී පිළිවෙළින් රු. 365,512,556/= ක් හා රු. 99,983,205/= ක් වශයෙන් විය.

| ස්ථාවර වත්කම් | 2012 රු.('000) | 2013 රු.('000) | 2014 රු.('000) |
|---|---|---|---|
| ආරම්භක වටිනාකම (පිරිවැයට) | 322,144 | 337,870 | 365,512 |
| ප්‍රකාශන | 93,163 | 99,983 | 93,143 |

## 04. බදු බැඳියාව

සංස්ථාව තක්සේරු වර්ෂ 2013/ 2014 සඳහා ආදායම් බදු වශයෙන් රු. 27,259,607/- ක මුදලක් සහ ලාභාංශ බදු වශයෙන් රු. 2,363,384/- ක මුදලක් ද සංස්ථාවේ 2014 වසරේ අවසාන ගිණුම් අනුව ප්‍රතිපාදනය කොට ඇත.

| බදු බැඳියාව | 2012 රු. ('000) | 2013 රු.('000) | 2014 රු.('000) |
|---|---|---|---|
| ආදායම් බදු | 39,359 | 30,828 | 27,260 |
| ලාභාංශ බදු | 12,899 | 5,454 | 2,363 |
| එකතුව | 52,258 | 36,282 | 29,623 |

## 05. ලාභය

2014 වසර තුළදී සංස්ථාව රු. 71,153,661/= ක බදු පූර්ව ලාභයක් උපයා ඇති අතර, එය 2013 වසරේදී රු. 78,095,872/= ක් විය.

| ලාභදායිතාව | 2012 රු. ('000) | 2013 රු.('000) | 2014 රු.('000) |
|---|---|---|---|
| බදු පූර්ව ලාභය | 140,567 | 78,096 | 71,154 |
| බදු ප්‍රතිපාදනයෙන් පසු | 88,309 | 41,813 | 41,531 |



## 06. ප්‍රසාද දීමනා

වාර්ෂික ප්‍රසාද දීමනා වශයෙන් සුදුසුකම් ලැබූ සේවකයින් සඳහා මාස 02 ක වැටුපකට සමාන මුදලක් ගෙවන ලදී. එසේ ගෙවන ලද මුළු ප්‍රසාද දීමනාව රු. 40,723,833/= කි. 2013 වසරට සාපේක්ෂව 15% ක වර්ධනයකි.

| ප්‍රසාද දීමනා | 2012 රු. ('000) | 2013 රු. ('000) | 2014 රු. ('000) |
|---|---|---|---|
| | 30,491 | 35,260 | 40,724 |




## 07. සුභ සාධනය

පහත සඳහන් සුභ සාධන සේවා හා පහසුකම් පසුගිය වර්ෂයේ පදනම යටතේ මෙම වසර තුළදී ද පවත්වා ගෙන යන ලදී. මේ වෙනුවෙන් සංස්ථාව වැය කළ මුදල රුපියල් මිලියන 103 ක් විය.

| | සුභ සාධනය | 2012 ('000) | 2013 ('000) | 2014 ('000) |
|---|---|---|---|---|
| 01. | සේවක ප්‍රවාහන පහසුකම් | 2,545 | 3,064 | 3,274 |
| 02. | සේවක දිරි දීමනා ගෙවීම් | 5,516 | 9,367 | 9,212 |
| 03. | වෛද්‍යාධාර ප්‍රතිලාභ ගෙවීම | 4,567 | 5,542 | 4,856 |
| 04. | සේවක විවිධ සුභ සාධනය | 9,424 | 17,845 | 27,016 |
| 05. | කම්කරු වන්දි ආරක්ෂණය | 191 | - | 216 |
| 06. | සියලුම සේවකයින් සඳහා ලිපිද්‍රව්‍ය තෑගි වවුචරයක් ප්‍රදානය කිරීම | 1,021 | 1,132 | 1,146 |
| 07. | සේවක ප්‍රසාද දීමනා | 30,491 | 35,260 | 40,724 |
| 08. | සේවක නිවාස ණය ප්‍රතිපූරණය | 3,918 | 4,207 | 4,935 |
| 09. | සේවක ඉතිරි නිවාඩු සඳහා ගෙවීම් | 9,170 | 11,319 | 13,051 |
| 10. | විශේෂ දිරි දීමනා | - | 3,495 | 3,408 |
| | එකතුව | 66,843 | 91,231 | 107,838 |

## 08. සේවක මණ්ඩලය

සමාලෝචනයට භාජනය වූ වර්ෂය තුළ සංස්ථාවේ සේවක සංඛ්‍යාව 705 කි.

| සේවක සංඛ්‍යාව | 2014 |
|---|---|
| කාර්යාලය | 81 |
| ප්‍රධාන මුද්‍රණාලය | 445 |
| ලිපිද්‍රව්‍ය කම්හල | 49 |
| ආරක්ෂක අංශය | 43 |
| අලෙවිසැල් | 54 |
| අනියම් හා කොන්ත්‍රාත් සේවකයින් | 22 |
| දෛනික වැටුප් ලබන කම්කරුවන් | 11 |

**2014 වර්ෂය තුළ දී සේවයෙන් ඉවත් වූ නිලධාරීන්**

| | නම/තනතුර | දිනය |
|---|---|---|
| 1. | එම්. එස්. එල්. කුරුප්පු මහතා සහකාර කළමනාකරු (ගබඩා) | 2014. 10. 11 |

# සමාප්තිය

සංස්ථාවේ වැඩ කටයුතු ඉතා සාර්ථක ලෙස කර ගෙන යාම සඳහා ඉතා ලැදිව සහයෝගය දුන් සංස්ථාවේ සියලු සේවකයන්ට සභාපතිතුමා ඇතුළු අධ්‍යක්ෂ මණ්ඩලයේ ස්තුතිය පිරිනැමේ. සාර්ථක වැඩ පිළිවෙළක් සඳහා සෑම විටම මග පෙන්වීම කරමින් සහාය ලබාදුන් ගරු පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ හා ජනමාධ්‍ය අමාත්‍යතුමාටත්, එම වැඩ පිළිවෙළට නිරතුරුව සහයෝගය ලබාදුන් අමාත්‍යාංශයේ ලේකම්තුමා ඇතුළු කාර්ය මණ්ඩලයටත් අධ්‍යක්ෂ මණ්ඩලයේ ස්තුතිය පිරිනැමේ.

ඉදිරි වර්ෂය තුළදී ද එවැනිම සහයෝගයක් හා ප්‍රතිචාරයක් සංස්ථාවේ සියලු සේවකයින්ගෙන් පාලනාධිකාරිය බලාපොරොත්තු වන්නේය.

**රවීන්ද්‍ර යසලාල් කලන්සූරිය**
සභාපති

## 1. සංස්ථාව පිළිබඳ තොරතුරු

### 1.1 පොදු තොරතුරු

1968 අංක 24 දරන පාර්ලිමේන්තු පනතට අනුව රාජ්‍ය මුද්‍රණ නීතිගත සංස්ථාව 1968 වසරේදී ස්ථාපනය කෙරිණි. ආයතනික අධ්‍යක්ෂ මණ්ඩලය එහි කළමනාකාරීත්වය භාරව ක්‍රියා කරයි. පාදුක්ක පානළුව ප්‍රදේශයේ මෙය පිහිටා තිබේ.

### 1.2 ප්‍රධාන කාර්යයන් හා මෙහෙයුම්වල ස්වභාවය

සංස්ථාවේ ප්‍රධාන කාර්යයන් වන්නේ පාසල් පෙළපොත් මුද්‍රණය, අභ්‍යාස පොත් නිෂ්පාදනය හා වෙනත් මුද්‍රණ කාර්යයන්.

## 2. සැකසුම සඳහා වන පදනම

මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනය, ආදායම් පිළිබඳ පුළුල් ප්‍රකාශනය, අරමුදල් හා මුදල් ගලා ඒමේ වෙනස්කම් සහ ප්‍රතිපත්ති මෙන්ම සටහන් සකසා ඇත්තේ LKAS සහ SLFRS යන ගිණුම්කරණ ප්‍රමිතීන් හා 1971 අංක 38 දරන මූල්‍ය පනතට අනුවය.

### 2.1 ඇගයුම සඳහා වන පදනම

උපචිත පදනම හා අතීත වැය පදනම් කර ගනිමින් මූල්‍ය ප්‍රකාශනය සකසා තිබේ.
ශ්‍රී ලංකා රුපියල්වලින් එය ඉදිරිපත් කර ඇත.

### 2.2 අඛණ්ඩ පැවැත්ම

සංස්ථාව පවත්වා ගෙන යාමට ඇති හැකියාව සම්බන්ධයෙන් අධ්‍යක්ෂ මණ්ඩලය තක්සේරුවක් සිදු කොට අවධානය යොමු කර ඇත. කෙසේ වෙතත් එය ඇවර කිරීමට හෝ මෙහෙයුම් නතර කිරීමට අධ්‍යක්ෂ මණ්ඩලය අපේක්ෂා නොකරයි.

# 3. වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති පිළිබඳ සාරාංශය

## 3.1 දේපළ, පිරියත හා උපකරණ

දේපළ, පිරියත හා උපකරණ එකතු කරන ලද ක්ෂයවීම් පිළිබඳ ශුද්ධ වැය යටතේ සඳහන් කර ඇත.

මුළුමනින්ම ක්‍ෂය වී ඇති එහෙත් තවමත් භාවිත කරන වත්කම්

| වත්කම් වර්ගීකරණය | මුළු පිරිවැය (රු.) | මුළුමනින්ම ක්ෂය වී ඇති දේපළවල වටිනාකම (රු.) | මුළුමනින්ම ක්ෂය වී ඇති දේපළවල වටිනාකම % ලෙස සමස්ත දේපළවල වටිනාකමින් |
|---|---|---|---|
| ගොඩනැගිලි | 38,020,440.00 | 6,683,778.00 | 18 |
| පිරියත හා යන්ත්‍රෝපකරණ | 217,243,529.00 | 127,242,410.00 | 59 |
| ලී බඩු හා සවිකිරීම් | 4,336,576.00 | 3,517,040.00 | 81 |
| මෝටර් රථ | 48,397,096.00 | 24,033,082.00 | 50 |
| කාර්යාලීය උපකරණ | 29,116,522.00 | 10,674,592.00 | 37 |
| විද්‍යුත් ප්‍රතිස්ථාපන | 2,572,951.00 | 2,572,951.00 | 100 |
| පරිගණක මෘදුකාංග | 32,919,366.00 | 25,005,774.00 | 76 |

ඉහත වර්ගීකරණය කර ඇති වත්කම් 31.12.2014 දිනට තවදුරටත් භාවිතයට ගත හැකි කාලය තක්සේරු කරමින් පවතින අතර මනා ගිණුම්කරණ සැලැස්මකින් අවශ්‍ය පියවර ගනු ඇත.

### 3.1.1 ක්‍ෂයවීම්

දේපළ, පිරියත සහ උපකරණවල ජීව ගුණය පිළිබඳ සෘජු තක්සේරුවකින් පසු ක්ෂය වීම් ගණනය කරනු ලැබේ.

තක්සේරු කරන ලද වත්මන් හා සංසන්දනාත්මක ජීව ගුණ වර්ෂ පහත පරිදි වේ.

| | |
|---|---|
| ගොඩනැගිලි | වසර 40 යි |
| පිරියත හා යන්ත්‍රෝපකරණ | වසර 13.33 යි |
| මෝටර් හා වෙනත් වාහන | වසර 4 යි |
| ලී බඩු හා සවිකිරීම් | වසර 10 යි |
| කාර්යාලයීය උපකරණ | වසර 10 යි |
| පරිගණක හා උපාංග | වසර 3 යි |
| කර්මාන්තශාලා උපකරණ හා අකුරු | වසර 4 යි |

## 3.2 තොගය

තොගය පිරිවැය හා ශුද්ධ උපලබ්ධිත අගය යන අගයන්ගෙන් අවම අගයට ගණනය කර ඇත.

## 3.3 බදුකරණය

බදුකරණ ක්‍රමවේදය හා 2006 අංක 10 දරන දේශීය ආදායම් පනතට අනුව සිදු කර ඇත.

## 3.4 මුදල් හා මුදල්වලට සමාන දෑ

# 4. මූල්‍ය උපාංග - මූලික හඳුනාගැනීම් හා ඉදිරි පියවර

## 4.1 මූල්‍ය වත්කම්

### 4.1.1 මූල්‍ය වත්කම් අපහායනය

(a) වෙළඳ ලැබීම් 2.5 මත ලබා දී ඇත.

(b) නියමිත කාල පරිච්ඡේදය ඇතුලත දී සමස්ත පෙළපොත් සංඛ්‍යාවම සැපයුම් නොකරන ලදී. ඒ නිසා අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුවෙන් නොලැබුණු මුදල් ප්‍රමාණය ඉදිරියේදී සැපයීම සිදු කරනු ලබයි. අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව විසින් පැනවූ දඩ ප්‍රමාණය පසුගිය අවුරුදු 5 තුළ වූ සාමාන්‍ය මත පදනම් විය.

## 4.2 මූල්‍ය බැඳුම්කර

සංස්ථා මූල්‍යකරණයේ මාධ්‍ය මහජන බැංකුවෙන් ලබා ගත් ණය පැකේජයකි. ඉඩම්, ගොඩනැගිලි හා ස්ථාවර යන්ත්‍රෝපකරණ පදනම මත එය ලබා ගෙන ඇත.

පසුගිය කාලයේ සේවක භාරකාර අරමුදලේ අඩි අය සඳහා බැඳුම්කරයක් ඇත.

### 4.2.1 අසම්භාව්‍ය බැරකම්

කම්කරු විනිශ්චය සභාව විසින් දෙනු ලැබූ තීන්දුවකට එරෙහි අභියාචනා 7ක් ද, මහාධිකරණයට කර ඇති අභියාචනා 17 ක් ද, දිස්ත්‍රික් උසාවියට කර ඇති පැමිණිලි 3ක් ද, අභියාචනා අධිකරණයට කර ඇති පැමිණිල්ලක් ද හමුවේ අසම්භාව්‍ය බැරකමක් සංස්ථාවට ඇත.

# 5. විශ්‍රාම පාරිතෝෂිත වගකීම්

1983 අංක 12 දරන අර්ථසාධක පනත යටතේ අර්ථසාධක ගෙවීමට සංස්ථාව බැඳී සිටී. අර්ථසාධක ගෙවීම කිසිදු හිඟයකින් තොරව සිදු කෙරිණ. 2014.12.31 දිනට අනුව ඇති ප්‍රතිපාදනවලට අනුව වෙනත් අරමුදලක් ස්ථාපනය නොකෙරිණ.

# 6. ආදායම් හා වියදම්

## 6.1 ආදායම් හඳුනාගැනීම

උපචිත පදනම මත සියලු ආදායම් හඳුනා ගැනේ.

පොලී මගින් ආදායම

සංස්ථා සේවකයන්ට ලබා දෙන ණය සඳහා 10% ක පොලියක් අය කරනු ලැබේ.

## 6.2 වියදම්

වසරේ ලාභය ගණනය කිරීමේදී ව්‍යාපාරය පවත්වා ගෙන යාම සඳහා දැරූ වියදම් සියල්ල ආදායම්වලින් අඩු කර ගෙන තිබේ.

## 6.3 ණයට ගැනුම් පිරිවැය

ණයට ඉල්ලා ගැනීම් සිදු වූ කාලය තුළ ඒවා වැය ලෙස හඳුනා ගැනේ.

# රජයේ මුද්‍රණ නීතිගත සංස්ථාව
# 2014 දෙසැම්බර් 31 දිනට
# මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශන

| | සටහන | 2014 රු. | 2013 රු. |
|---|---|---|---|
| **වත්කම්** | | | |
| ජංගම නොවන වත්කම් | | | |
| දේපළ, පිරියත හා උපකරණ | 15 | 93,143,946 | 99,983,204 |
| | | **93,143,946** | **99,983,204** |
| ජංගම වත්කම් | | | |
| තොගය | 16 | 374,745,859 | 307,846,607 |
| වෙළඳ ලැබීම් | 17 | 789,934,471 | 733,280,245 |
| වෙනත් ලැබීම් | 18 | 165,575,584 | 143,145,763 |
| පූර්ව ගෙවීම් | | 11,704 | 92,221 |
| මුදල් හා මුදල්වලට සමාන දෑ | 19 | 5,425,708 | 4,659,788 |
| | | 1,335,693,326 | 1,189,024,624 |
| මුළු වත්කම් | | **1,428,837,272** | **1,289,007,828** |
| ස්කන්ධය හා බැරකම් | | | |
| ප්‍රාග්ධන නිකුතුව | | 15,000,000 | 15,000,000 |
| සංචිත | | 15,003,633 | 15,003,633 |
| රඳවා ගත් ඉපයීම් | | 321,839,104 | 283,100,175 |
| මුළු ස්කන්ධය | | **351,842,737** | **313,103,808** |
| ජංගම නොවන බැරකම් | | | |
| විශ්‍රාම ප්‍රතිලාභ වගකීම් | | 151,387,409 | 129,410,948 |
| දිගු කාලීන ණය සඳහා පොළී | | - | 6,167,715 |
| Provision for panulty | | 23,449,201 | - |
| | | **174,836,610** | **135,578,663** |
| ජංගම බැරකම් | | | |
| වෙළඳ ගෙවීම් | 20 | 338,137,042 | 310,892,870 |
| වෙනත් ගෙවීම් | 21 | 32,346,639 | 45,041,289 |
| කෙටි කාලීන ණය සඳහා පොළී | | 494,970,217 | 437,919,685 |
| බැංකු අයිරා | | 36,704,028 | 46,471,513 |
| මුළු බැරකම් | | 902,157,926 | 840,325,357 |
| මුළු ස්කන්ධය හා බැරකම් | | **1,428,837,272** | **1,289,007,828** |

සංස්ථාවේ මෙම මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මූල්‍ය පනතේ අවශ්‍යතාවන්ට අනුකූල බව සහතික කරමු.

..............................
එන්. ඩී. ප්‍රියංකර කුමාර
මූල්‍ය කළමනාකරු

මෙම මූල්‍ය ප්‍රකාශන සැකසීම හා ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් අධ්‍යක්ෂ මණ්ඩලය වගකීම් දරයි. ඒවා අධ්‍යක්ෂ මණ්ඩලය අනුමත කර ඇති අතර ඔවුන් වෙනුවෙන් අත්සන් තබා තිබේ. පිටු අංක 15, 16 සහ 17 හි ඇතුළත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ පිටු අංක 19, 20 මෙන්ම 24 සිට 26 දක්වා ඇතුළත් අදාළ සටහන් මෙම මූල්‍ය ප්‍රකාශනවල වැදගත්ම අංග වේ.

..............................
රවීන්ද්‍ර යසලාල් කලන්සූරිය
සභාපති/අධ්‍යක්ෂ

..............................
ඩබ්. ඒ. ඩී. එස්. ගුණසිංහ
අධ්‍යක්ෂ

# රජයේ මුද්‍රණ නීතිගත සංස්ථාව
# 2014 දෙසැම්බර් 31 දිනට
# මූල්‍ය තත්ත්වයට අදාළ සටහන්

| | 2014 | 2013 |
|---|---|---|
| | රු. | රු. |
| 16. තොගය | | |
| අමුද්‍රව්‍ය | 242,489,191 | 158,194,164 |
| පාරිභෝගික භාණ්ඩ | 4,557,130 | 5,767,154 |
| අමතර කොටස් | 36,680,545 | 50,815,440 |
| දෘඪාංග | 500,029 | 717,350 |
| නිමි තොගය | 59,872,687 | 74,557,352 |
| නොනිමි තොගය | 30,646,277 | 17,795,146 |
| | **374,745,859** | **307,846,606** |

| | 2014 | 2013 |
|---|---|---|
| | රු. | රු. |
| 17. වෙළඳ ලැබීම් | | |
| වෙළඳ ණයගැතියෝ | 809,256,090 | 750,607,688 |
| බොල් ණය සඳහා වෙන් කිරීම් | (20,231,402) | (18,765,192) |
| වෙනත් ණයගැතියෝ | 909,782 | 1,437,749 |
| | **789,934,471** | **733,280,245** |

| | 2014 | 2013 |
|---|---|---|
| | රු. | රු. |
| 18. වෙනත් ලැබීම් | | |
| සේවක ණය හා අත්තිකාරම් (සටහන 18.1) | 20,964,497 | 24,803,473 |
| තැන්පතු හා ලැබීම් (සටහන 18.2) | 5,746,572 | 6,066,344 |
| විකුණුම් පාලන ගිණුම | (1,443,477) | (2,288,897) |
| බැංකු ණය | 140,307,992 | 114,564,843 |
| | **165,575,584** | **143,145,763** |

| | 2014 | 2013 |
|---|---|---|
| | රු. | රු. |
| 18.1 සේවක ණය හා අත්තිකාරම් | | |
| ණය හිමි අත්තිකාරම් ගිණුම | 1,521,556 | 1,680,649 |
| ආපදා ණය | 16,193,582 | 20,979,465 |
| උත්සව අත්තිකාරම් | 2,756,413 | 2,132,913 |
| සේවක වැටුප් අත්තිකාරම් | 492,945 | 10,445 |
| | **20,964,497** | **24,803,472** |

| | 2014 | 2013 |
|---|---|---|
| | රු. | රු. |
| 18.2 තැන්පතු හා ලැබීම් | | |
| තැන්පතු සඳහා ලැබීම් | 5,193,075 | 5,546,088 |
| අමතර වෙනත් ලැබීම් | 553,497 | 520,256 |
| | **5,746,572** | **6,066,344** |

| | | |
|---|---|---|
| 19. මුදල් හා මුදල්වලට සමාන දෑ | | |
| බැංකුවේ ඇති මුදල් | 2,214,824 | 1,463,801 |
| මාර්ගස්ථ මුදල් | 3,129,182 | 3,090,537 |
| අතැති මුදල් | 81,702 | 105,450 |
| | **5,425,708** | **4,659,788** |

මුදල් ගලා ඒම, මුදල් සහ මුදල් හා සමාන ප්‍රකාශනය සඳහා වන තොරතුරු පහත පරිදි වේ.

| | 2014<br>රු. | 2013<br>රු. |
|---|---|---|
| බැංකුවේ ඇති මුදල් | 2,214,824 | 1,463,801 |
| මාර්ගස්ථ මුදල් | 3,129,182 | 3,090,537 |
| අතැති මුදල් | 81,702 | 105,450 |
| | 5,425,708 | 4,659,787 |
| බැංකු අයිරා | (36,704,028) | (46,471,513) |
| | **(31,278,320)** | **(41,811,725)** |

| | 2014<br>රු. | 2013<br>රු. |
|---|---|---|
| 20. වෙළඳ ගෙවීම් | | |
| වෙළඳ ණය හිමියන් | 59,781,032 | 54,174,102 |
| වෙනත් ණය හිමියන් | 77,517,303 | 74,259,098 |
| දේශීය ආදායම් දෙපාර්තමේන්තුව | 200,835,799 | 181,144,726 |
| විකුණුම් අත්තිකාරම් | 2,909 | 1,314,944 |
| | **338,137,042** | **310,892,870** |

| | 2014<br>රු. | 2013<br>රු. |
|---|---|---|
| 21. වෙනත් ගෙවීම් | | |
| උපචිත වියදම් | 29,969,046 | 42,566,766 |
| තැන්පතු ගෙවීම් | 2,377,593 | 2,474,523 |
| | **32,346,639** | **45,041,289** |

# රජයේ මුද්‍රණ නීතිගත සංස්ථාව
# 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වසර සඳහා
# මුදල් ප්‍රවාහ ප්‍රකාශය

| | | 2014 | 2013 |
|---|---|---|---|
| | | රු. | රු. |
| මෙහෙයුම් කටයුතුවලින් ගලා ආ මුදල් ප්‍රවාහය | | 71,153,661 | 78,095,872 |
| බදු පෙර ලාභය | | | |
| ගැළපීම්: | | | |
| ස්ථාවර වත්කම් ක්ෂය | | 16,428,062 | 18,715,828 |
| පෙර වර්ෂයේ ගැළපීම් | | 86,702,069 | (94,418,994) |
| මූල්‍ය වියදම් | | 67,498,596 | 62,548,766 |
| පාරිතෝෂික සඳහා වසර තුළ වෙන්කළ ප්‍රතිපාදන | | 26,774,796 | 21,754,712 |
| කාරක ප්‍රාග්ධන වෙනස්වීම්වලට පෙර මෙහෙයුම් ලාභය | | **268,557,184** | **86,696,184** |
| කාරක ප්‍රාග්ධන වෙනස්වීම | | | |
| තොගය (වැඩිවීම) / අඩුවීම | | (66,899,253) | 38,191,599 |
| (වැඩිවීම්)/ වෙළඳ හා වෙනත් ලැබීම් අඩුවීම | | (56,654,226) | (256,498,488) |
| (වැඩිවීම්)/ වෙනත් ලැබීම්වල අඩුවීම | | (22,429,821) | (40,769,732) |
| ජංගම බැරකම්වල වැඩි/(අඩුවීම) | | (5,141,550) | 28,775,740 |
| මෙහෙයුම් කටයුතුවලින් ගලා ආ මුදල් ප්‍රවාහය | | **(151,124,850)** | **(143,604,697)** |
| ගෙවූ බදු | | (75,896,011) | 92,604,587 |
| සේවක විශ්‍රාමික ප්‍රතිලාභ ගෙවීම | | (4,798,335) | (2,744,168) |
| මෙහෙයුම් කටයුතුවලින් ගලා ආ මුදල් ප්‍රවාහය | | **36,737,988** | **(53,744,276)** |
| ආයෝජන කටයුතුවලින් ගලා ආ මුදල් ප්‍රවාහය | | | |
| දේපළ, පිරියත, උපකරණ මිලදී ගැනීම | | (9,588,804) | (27,641,737) |
| ආයෝජන කටයුතුවලින් ශුද්ධ මුදල් ගලාඒම | | **(9,588,804)** | **(27,641,737)** |
| මූල්‍ය කටයුතුවලින් මුදල් ගලා ඒම | | | |
| ණයට ගැනුම් සඳහා ගෙවීම් | | 50,882,817 | 135,300,821 |
| පොළී ගෙවීම | | (67,498,596) | (62,548,766) |
| මූල්‍ය කටයුතුවලින් ශුද්ධ මුදල් ගලා ඒම | | **(16,615,779)** | **72,752,055** |
| ශුද්ධ වැඩිවීම් / (අඩුවීම්) මුදල් හා මුදල්වලට සමාන දෑ | | **10,533,405** | **(8,633,959)** |
| කාලසීමාව ආරම්භයේ මුදල් හා මුදල්වලට සමාන දෑ | | **(41,811,725)** | **(33,177,766)** |
| කාලසීමාව අවසානයේ මුදල් හා මුදල්වලට සමාන දෑ | සටහන 19 | **(31,278,320)** | **(41,811,725)** |

# රජයේ මුද්‍රණ නීතිගත සංස්ථාව
# 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වසර සඳහා
# හිමිකම වෙනස්වීමේ ප්‍රකාශය

| | ප්‍රාග්ධන නිකුතුව රු. | ප්‍රාග්ධන සංචිතය රු. | පොදු සංචිතය රු. | සංවර්ධන සංචිතය රු. | රඳවාගත් ඉපැයීම් රු. | එකතුව රු. |
|---|---|---|---|---|---|---|
| 2013. 01. 01 වැනි දිනට ශේෂය | 15,000,000 | 102,491 | 1,000,000 | 13,901,142 | 337,811,584 | 367,815,217 |
| ලාභය/(පාඩුව) වසර සඳහා | - | - | - | - | 41,813,401 | 41,813,401 |
| පෙර වර්ෂයේ ගැළපීම් | - | - | - | - | (96,524,810) | (96,524,810) |
| 2013.12.31 දිනට ශේෂය | 15,000,000 | 102,491 | 1,000,000 | 13,901,142 | 283,100,175 | 313,103,808 |
| 2014.01.01 දිනට ශේෂය | **15,000,000** | **102,491** | **1,000,000** | **13,901,142** | **283,100,175** | **313,103,808** |
| ලාභය/(පාඩුව) වසර සඳහා | | | | | 41,530,670 | 41,530,670 |
| පෙර වර්ෂය සඳහා ගැළපීම් | | | | | (2,791,741) | (2,791,741) |
| 2014.12.31 දිනට ශේෂය | **15,000,000** | **102,491** | **1,000,000** | **13,901,142** | **321,839,104** | **351,842,737** |

# රජයේ මුද්‍රණ නීතිගත සංස්ථාව
# 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීරණ ආදායම් ප්‍රකාශය

| | සටහන් | 2014<br>රු. | 2013<br>රු. |
|---|---|---|---|
| ආදායම | 7 | 1,334,036,310 | 1,236,901,899 |
| විකුණුම් පිරිවැය | 8 | (878,824,960) | (801,809,829) |
| දළ ලාභය | | 455,211,350 | 435,092,070 |
| වෙනත් මෙහෙයුම්වලින් ආදායම | 9 | 8,280,234 | 6,891,679 |
| බෙදාහැරීමේ වියදම් | 10 | (28,652,368) | (35,755,152) |
| පරිපාලන වියදම් | 11 | (199,688,025) | (185,818,553) |
| වෙනත් මෙහෙයුම් සඳහා වියදම් | 12 | (98,257,868) | (81,262,847) |
| මෙහෙයුම් ලාභය | | 136,893,323 | 139,147,197 |
| මූල්‍ය ආදායම | | 1,758,935 | 1,497,441 |
| මූල්‍ය වියදම් | 13 | (67,498,596) | (62,548,766) |
| බදු පෙර ලාභය | | 71,153,661 | 78,095,872 |
| ආදායම් බදු | 14 | (29,622,991) | (36,282,471) |
| බදු පසු ලාභය | | **41,530,670** | **41,813,401** |

# 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් ප්‍රකාශය

| | 2014<br>රු. | 2013<br>රු. |
|---|---|---|
| වාර්ෂික ලාභය | 41,530,670 | 41,813,401 |
| වෙනත් විස්තීරණ ආදායම් | - | - |
| වර්ෂය තුළ මුළු විස්තීරණ ආදායම් | 41,530,670 | 41,813,401 |

## රජයේ මුද්‍රණ නීතිගත සංස්ථාව
## 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්

| | 2014 රු. | 2013 රු. |
|---|---|---|
| **07. ආදායම්** | | |
| ලිපිද්‍රව්‍ය කර්මාන්තශාලාවෙන් ලද ආදායම | 231,584,796 | 211,757,807 |
| ප්‍රධාන මුද්‍රණාලයෙන් ලද ආදායම | | |
| පෙළපොත් | 642,847,478 | 756,660,138 |
| ජොබ් වැඩ | 440,729,338 | 244,648,596 |
| ප්‍රකාශන | 218,382 | 168,676 |
| වෙනත් අලෙවි කටයුතුවලින් ලද ආදායම | 18,656,316 | 23,666,684 |
| | **1,334,036,310** | **1,236,901,901** |

| | 2014 රු. | 2013 රු. |
|---|---|---|
| **08. විකුණුම් පිරිවැය** | | |
| ප්‍රධාන මුද්‍රණාලය | | |
| පරිභෝජනය කළ ද්‍රව්‍ය | 429,959,088 | 368,326,457 |
| සෘජු ශ්‍රමය | 157,912,108 | 141,965,226 |
| සෘජු කර්මාන්තශාලා වියදම් | 47,222,425 | 37,008,278 |
| වක්‍ර කර්මාන්තශාලා වියදම් | 54,418,700 | 39,933,888 |
| අනෙකුත් වියදම් | 10,602,024 | 29,682,042 |
| | **700,114,344** | **616,915,891** |
| ලිපිද්‍රව්‍ය කර්මාන්තශාලාව | | |
| පරිභෝජනය කළ ද්‍රව්‍ය | 122,825,306 | 135,971,719 |
| සෘජු ශ්‍රමය | 22,365,113 | 21,039,530 |
| සෘජු කර්මාන්තශාලා වියදම් | 4,048,854 | 3,762,478 |
| වක්‍ර කර්මාන්තශාලා වියදම් | 1,941,292 | 1,956,692 |
| අනෙකුත් වියදම් | 19,345,014 | 4,040,032 |
| | 170,525,579 | 166,770,451 |
| ප්‍රකාශන අංශයේ පිරිවැය | 225,934 | 335,786 |
| අනෙකුත් අංශවල පිරිවැය | 7,959,103 | 17,787,701 |
| මුළු විකුණුම් පිරිවැය | **878,824,960** | **801,809,829** |

| | 2014 රු. | 2013 රු. |
|---|---|---|
| **09. වෙනත් මෙහෙයුම්වලින් ලද ආදායම** | | |
| විවිධ ආදායම් | 7,498,651 | 6,514,943 |
| ටෙන්ඩර් තැන්පතු | 781,583 | 376,735 |
| | **8,280,234** | **6,891,678** |

| | 2014 රු. | 2013 රු. |
|---|---|---|
| **10. බෙදාහැරීම් වියදම්** | | |
| ආර්ථික සේවා ගාස්තු | 3,260,748 | 3,127,786 |
| ජාතිය ගොඩනැගීමේ බද්ද | 14,728,700 | 16,488,493 |
| මෝටර් රථවාහන නඩත්තුව | 4,461,840 | 4,320,709 |
| බොල් ණය සඳහා ප්‍රතිපාදන | 1,466,210 | 5,131,721 |
| දැන්වීම් සඳහා | 1,453,619 | 5,673,521 |
| අලෙවි ප්‍රවර්ධන කටයුතු | 3,270,984 | 970,861 |
| වෙළඳසැල නඩත්තු කිරීමට | 10,267 | 42,061 |
| විකුණුම් කොමිස් | - | - |
| | **28,652,368** | **35,755,152** |

| | | 2014 | 2013 |
|---|---|---|---|
| | | රු. | රු. |
| **11.** | **පරිපාලන වියදම්** | | |
| | කුලී | 3,059,629 | 2,832,598 |
| | ඉඩම් හා ගොඩනැගිලි නඩත්තු | 2,327,238 | 2,772,075 |
| | විදුලිය | 195,470 | 249,831 |
| | කාර්යාල උපකරණ නඩත්තුව | 432,232 | 259,879 |
| | ක්ෂයවීම් - කාර්යාලයීය උපකරණ | 1,804,769 | 1,581,317 |
| | - ගෘහභාණ්ඩ හා උපාංග | 91,188 | 89,854 |
| | - පරිගණක මෘදුකාංග | 1,287,337 | 680,766 |
| | - යතුරුපැදි | - | - |
| | වරිපනම් | 78,052 | 212,963 |
| | ජලය | 49,426 | 40,066 |
| | වැටුප් හා වේතන | 106,717,208 | 96,758,524 |
| | අතිකාල දීමනා | 10,370,043 | 9,320,660 |
| | සේවක අර්ථසාධක අරමුදල | 14,264,339 | 12,622,832 |
| | සේවක භාරකාර අරමුදල | 3,565,357 | 3,157,175 |
| | දිරි දීමනා | 2,540,610 | 2,569,050 |
| | සභාපති වේතනය | 690,000 | 720,000 |
| | උප සභාපති වේතනය | 458,347 | 135,000 |
| | අධ්‍යක්ෂ ගාස්තු | 288,000 | 213,600 |
| | තැපැල් ගාස්තු | 178,089 | 199,893 |
| | දුරකථන | 1,526,887 | 1,378,238 |
| | පුවත්පත් දැන්වීම් හා ප්‍රකාශන | - | 147,900 |
| | ප්‍රවාහනය | 1,609,818 | 1,097,565 |
| | පුවත්පත් හා වාර සඟරා | 66,910 | 77,630 |
| | විදේශ සංචාර / සේවක පුහුණුවීම් (විදේශ) | 3,038,518 | 2,101,090 |
| | අන්තර්ජාල / විද්‍යුත් තැපැල | 412,164 | 283,916 |
| | මුද්‍රණ හා ලේඛන | 4,733,025 | 2,650,336 |
| | විගණන වියදම් | - | 1,000,000 |
| | වින්දනාත්මක කටයුතු | 366,964 | 868,443 |
| | නෛතික හා උපදේශන සේවා | 596,557 | 1,289,002 |
| | 25% මෝටර් රථවාහන නඩත්තුව | 4,461,840 | 4,320,709 |
| | පොදු කාර්යාලයීය වියදම් | 2,816,822 | 1,640,747 |
| | විවිධ වියදම් | 76,250 | 816,940 |
| | පාරිතෝෂික වියදම් | 26,774,796 | 21,754,712 |
| | ටෙන්ඩර් මණ්ඩල තාක්ෂණික කමිටු වියදම් | 801,550 | 575,625 |
| | මුදල් පරිවාර වියදම් | 33,000 | 73,904 |
| | සාමාජික ගාස්තු | 37,500 | 22,500 |
| | සේවක පුහුණු කිරීම් | 597,850 | 240,640 |
| | නවාතැන් පහසුකම් | 254,591 | 1,117,483 |
| | අධ්‍යක්ෂ මණ්ඩල හමු සඳහා වියදම් | 259,268 | 540,231 |
| | ආධාර | 1,781,697 | 7,761,599 |
| | මෝටර් රථවාහන කුලී | 1,044,686 | 1,232,414 |
| | අලෙවි විශ්ලේෂණ ගාස්තු | - | 277,910 |
| | මුදල් ප්‍රවාහන ගාස්තු | - | 75,606 |
| | පරිගණක කාර්යංශ සේවා ගාස්තු | - | 57,331 |
| | | **199,688,025** | **185,818,554** |

| | | 2014 | 2013 |
|---|---|---|---|
| | | රු. | රු. |
| **12.** | **වෙනත් මෙහෙයුම් වියදම්** | | |
| | සේවක සුභසාධනය | 27,015,994 | 17,845,411 |
| | සේවක වෛද්‍ය පහසුකම් | 4,855,939 | 5,541,863 |
| | නිවාස ණය පොලී | 4,935,271 | 4,207,441 |
| | කාර්ය මණ්ඩලය සඳහා ප්‍රසාද දීමනා | 40,723,833 | 35,259,829 |
| | විශේෂ දිරි දීමනා | 3,408,170 | 3,495,000 |
| | කාර්ය මණ්ඩල ප්‍රවාහනය | 3,274,388 | 3,064,447 |
| | නිවාඩු සඳහා ගෙවීම් | 13,051,103 | 11,319,121 |
| | උපයන විට ගෙවීම් බදු | 993,171 | 529,736 |
| | | **98,257,868** | **81,262,848** |

| | 2014 | 2013 |
|---|---|---|
| | රු. | රු. |
| 13. මූල්‍ය වියදම් | | |
| බැංකු ගාස්තු | 8,640,167 | 8,214,558 |
| බැංකු අයිරා පොලී | 4,700,100 | 6,301,167 |
| බැංකු ණය පොලී - කෙටි කාලීන | 53,633,209 | 46,531,402 |
| බැංකු ණය පොලී - දිගු කාලීන | 525,121 | 1,501,638 |
| දඩ ගාස්තු | - | - |
| | **67,498,596** | **62,548,765** |

| | 2014 | 2013 |
|---|---|---|
| | රු. | රු. |
| 14. ආදායම් බදු | | |
| වසර සඳහා ආදායම් බදු ප්‍රතිපාදන | 27,259,607 | 30,828,194 |
| ලාභාංශ බදු සඳහා ප්‍රතිපාදන | 2,363,384 | 5,454,277 |
| | **29,622,991** | **36,282,471** |

15 දේපළ පිරියත සහ උපකරණ

| විස්තරය | 2013.01.01. දිනට | වසර තුළ මිලදී ගැනීම් හා ප්‍රත්‍යාගණය | වර්ෂය තුළදී ඉවත් කිරීම් | 2013.12.31 දිනට ශේෂය | වසර සඳහා අමතර හා ප්‍රතිප්‍රමාණ වියදම් | වර්ෂය තුළදී ඉවත් කිරීම් | 2014. 12. 31 දිනට |
|---|---|---|---|---|---|---|---|
| වියදම් | | | | | | | |
| ඉඩම් | 475,126 | - | - | 475,126 | - | - | 475,126 |
| ගොඩනැගිලි | 37,182,060 | - | - | 37,182,060 | 838,380 | - | 38,020,440 |
| පිරියත හා යන්ත්‍රෝපකරණ | 209,213,597 | 5,861,034 | - | 215,074,631 | 2,168,898 | - | 217,243,529 |
| ලී බඩු හා සවිකිරීම් | 4,315,476 | 21,100 | - | 4,336,576 | - | - | 4,336,576 |
| කර්මාන්තශාලා උපකරණ හා අකුරු | 22,733,072 | 5,255,437 | - | 27,988,509 | 1,128,013 | - | 29,116,522 |
| මාන්ත උපාංග හා ව | 1,804,481 | 130,095 | - | 1,934,576 | 30,179 | - | 1,964,755 |
| ඉලෙක්ට්‍රොනික ප්‍රතිස්ථාපන | 2,572,951 | - | - | 2,572,951 | - | - | 2,572,951 |
| මෝටර් හා වෙනත් වාහන | 32,656,025 | 15,741,071 | - | 48,397,096 | - | - | 48,397,096 |
| පරිගණක හා උපාංග | 26,918,031 | 633,000 | - | 27,551,031 | 5,423,335 | - | 32,974,366 |
| **එකතුව** | **337,870,819** | **27,641,737** | - | **365,512,556** | **9,588,805** | | **375,101,361** |
| සමුච්චිත ක්ෂයවීම් | | | | | | | |
| ගොඩනැගිලි | 26,716,453 | (34,852) | 762,457 | 27,444,058 | 783,417 | - | 28,227,475 |
| පිරියත හා යන්ත්‍රෝපකරණ | 150,961,884 | 123,964 | 8,549,986 | 159,635,834 | 6,565,954 | - | 166,201,788 |
| ලී බඩු හා සවිකිරීම් | 3,724,676 | (73,402) | 89,854 | 3,741,128 | 91,188 | - | 3,832,316 |
| කාර්යාලයීය උපකරණ | 13,860,915 | (79,119) | 1,581,317 | 15,363,113 | 1,804,769 | - | 17,167,882 |
| කර්මාන්තශාලා උපකරණ හා අකුරු | 1,475,589 | - | 97,566 | 1,573,155 | 94,127 | - | 1,667,282 |
| ඉලෙක්ට්‍රොනික ප්‍රතිස්ථාපන | 2,572,950 | - | | 2,572,950 | - | - | 2,572,950 |
| මෝටර් හා වෙනත් වාහන | 22,908,560 | 1,811,587 | 5,193,641 | 29,913,788 | 4,778,107 | - | 34,691,895 |
| පරිගණක හා උපාංග | 22,486,680 | 357,638 | 2,441,008 | 25,285,326 | 2,310,500 | - | 27,595,826 |
| **එකතුව** | **244,707,707** | **2,105,816** | **18,715,829** | **265,529,352** | **16,428,062** | - | **281,957,414** |
| ලියා හල අගය | **93,163,112** | **25,535,921** | **(18,715,829)** | **99,983,204** | **(6,839,257)** | - | **93,143,947** |

විගණකාධිපති දෙපාර්තමේන්තුව
கணக்காய்வாளர் தலைமை அதிபதி திணைக்களம்
AUDITOR GENERAL'S DEPARTMENT

මගේ අංකය / எனது இல. / My No. } ටීඑම්/ජී/එස්පීසී/1/14/42

ඔබේ අංකය / உமது இல. / Your No. }

දිනය / திகதி / Date } 2015 අගෝස්තු 24 දින

සභාපති

රාජ්‍ය මුද්‍රණ නීතිගත සංස්ථාව.

**රාජ්‍ය මුද්‍රණ නීතිගත සංස්ථාවේ 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 1971 අංක 38 දරන මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව.**

---

රාජ්‍ය මුද්‍රණ නීතිගත සංස්ථාවේ 2014 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තිය සහ 1968 අංක 24 දරන රාජ්‍ය මුද්‍රණ නීතිගත සංස්ථා පනතේ 23 වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුලත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර සංස්ථාවේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත්කල යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

## 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම.

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

## 1.3 විගණකගේ වගකීම

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000-1810 ) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදුකරන ලදී. අවාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වන්නේද යන්න පිළිබඳව සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැලැසුම් කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට උපකාරී වන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුලත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් අවදානම් තක්සේරු කිරීම් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස සංස්ථාවේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් සංස්ථාවේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගැයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගැයීමද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය හා ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) සහ (4) උපවගන්ති වලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

## 2. මූල්‍ය ප්‍රකාශන

### 2.1 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2014 දෙසැම්බර් 31 දිනට රාජ්‍ය මුද්‍රණ නීතිගත සංස්ථාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

#### 2.2.1 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති

පහත දැක්වෙන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම් විගණනයේදී නිරීක්ෂණය විය.

(අ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති අංක 01

වත්කම් හා වගකීම් එකිනෙකට හිලව්කර මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් නොකළ යුතු වුවද, අනෙකුත් ලැබිය යුතු ශේෂයන්ට විකුණුම් පාලන ගිණුමෙහි බැර ශේෂයන් රු. 1,443,477 ක් හිලව්කර මූල්‍ය ප්‍රකාශනවල පෙන්නුම් කර තිබුණි.

(ආ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති අංක 02

අවසන් තොගවල වටිනාකම, පිරිවැය හෝ ශුද්ධ උපලබ්ධි යන අගයන්ගෙන් වඩා අඩු අගයට මූල්‍ය ප්‍රකාශනවල දක්වා ඇතිබව අනාවරණය කර තොගවල අගය එහි පිරිවැය වූ රු. 374,745,859 අගය මත මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබූ නමුත් පිරිවැය හා තොගවල ශුද්ධ උපලබ්ධි අගය සමග සැසඳුම් කළ බවට සාක්ෂි විගණනයට ඉදිරිපත් නොකෙරුණි.

(ඇ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති අංක 07

සමාලෝචිත වර්ෂයේ මුදල් ප්‍රවාහයට අදාළ නොවන ඉකුත් වර්ෂයට අදාළ ගැලපීම් රු. 86,702,069 ක් ද බදු ගෙවීම් රු. 42,583,879 ක් ද ගලපා තිබුණි.

(ඇ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති අංක 08

ඉකුත් වර්ෂවලට අදාළ වැරදි නිවැරදි කිරීම් අතීතානුයෝගීව ගලපා ඉකුත් වර්ෂයේ මූල්‍ය තත්ත්වය ප්‍රතිෂ්ඨාපනය කිරීමට කටයුතු නොකර රු. 16,628,392 ක මුදලක් ඉකුත් වර්ෂයෙන් ඉදිරියට ගෙන එන ලද සමුච්චිත ලාභයට ගලපා තිබුණි.

(ඉ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති අංක 12

විලම්භිත බදු ගිණුම් තැබීම සම්බන්ධ ගිණුම්කරණ ප්‍රතිපත්තිය මූල්‍ය ප්‍රකාශනවල අනාවරණය කර නොතිබුණි. විශේෂයෙන් බදු ගණනයේදී පැනනගින තාවකාලික වෙනස්කම් ( Temporary Difference ) සහ ස්ථිර වෙනස්කම් ( Permanent Difference ) හඳුනාගෙන මූල්‍ය ප්‍රකාශනවල අනාවරණය කර නොතිබුණි.

(ඊ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති අංක 16

පිරිවැය රු. 199,729,627 ක්වූ සම්පූර්ණයෙන් ක්ෂය කර තිබුණු නමුත් තවදුරටත් භාවිතයට ගනු ලැබූ වත්කම් පිළිබඳව මූල්‍ය ප්‍රකාශනවල අනාවරණය කර නොතිබුණි. එසේම රු. මිලියන 494 ක ණය මුදලක් ලබා ගැනීම සඳහා ඇපයට තබා තිබුණු ඉඩම්, ගොඩනැගිලි හා යන්ත්‍ර සම්බන්ධව විස්තර සහ උකසේ ස්වභාවය සම්බන්ධව විස්තර මූල්‍ය ප්‍රකාශනවල අනාවරණය කර නොතිබුණි.

(උ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති අංක 19

විශ්‍රාම ප්‍රතිලාභ ගිණුම් තැබීම සම්බන්ධව විශ්‍රාම ප්‍රතිලාභ සැලසුම පිළිබඳ සාමාන්‍ය විස්තරයක් , ආරම්භක හා අවසාන ශේෂයන්වල වර්තමාන අගය ගැලපීම් විස්තර, වර්තමාන සේවා පිරිවැය, පොළී , ආගණිත ලාභ හෝ අලාභ ( Actuarial gain or loss) සහ පසුගිය සේවා පිරිවැය යනාදී තොරතුරු හඳුනාගෙන එහි ලාභය හෝ අලාභය ගැලපූ ආකාරය මූල්‍ය ප්‍රකාශනවල අනාවරණය කර නොතිබුණි.

(ඌ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති අංක 23

ණය ගැනුම් පිරිවැය ප්‍රාග්ධනිත කිරීම පිළිබඳ සළකා බලා ඒ අනුව කටයුතු කිරීමට අයිතිත්වයන් උනන්දු කර තිබුණද සංස්ථාව විසින් ප්‍රාග්ධනිත කළ හැකි ණය ගැනුම් පිරිවැය හඳුනාගෙන සුදුසුකම්ලත් වත්කම්වලට අදාල ණය ගැනුම් පිරිවැය ප්‍රාග්ධනිත කිරීමට කටයුතු නොකර පුනරාවර්තන වියදමක් ලෙස ආදායමට ලියා හැර තිබුණි.

(එ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති අංක 24

සම්බන්ධිත පාර්ශව සහ වෙනත් රාජ්‍ය ආයතන සමග කරන ලද ගනුදෙනුවල ස්වභාවය සහ හිටපු සභාපතිවරයාගේ පෞද්ගලික ලේකම් මාර්ගයෙන් සිදුකරන ලද ගනුදෙනුවල විස්තර මූල්‍ය ප්‍රකාශනවල අනාවරණය කර නොතිබුණි.

(ඒ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති අංක 39

වටිනාකම රු. 809,256,090 ක් වූ වෙළඳ ණයගැතියන් හායනය වූ වටිනාකම ගණනය කිරීමකින් තොරව ණයගැතියන්ගෙන් රු. 20,231,402 ක බොල්ණය වෙන්කිරීමක් අඩුකර මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ පෙන්නුම් කර තිබුණි.

### 2.2.2 ගිණුම්කරණ ප්‍රතිපත්ති

------------------------

සමස්ථ ණයගැතියන්ගෙන් සියයට 2.5 ක් බොල් හා අඩමාණ ණය වෙන්කිරීම සංස්ථාවේ ප්‍රතිපත්තිය වුවද අවුරුදු පහකට වැඩි කාලයක් තිස්සේ අය නොවන ණය ප්‍රමාණය රු. මිලියන 43 ක් ඉක්මවා තිබීම හේතුවෙන් නොලැබෙන ණය වෙනුවෙන් ප්‍රමාණවත් වෙන් කිරීමක් සිදු නොවන බව නිරීක්ෂණය විය.

### 2.2.3 ගිණුම්කරණ අඩුපාඩු

------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ජාතිය ගොඩනැගීමේ බදු වියදම ගිණුම්ගත කිරීමේදී සංස්ථාව විසින් දරන ලද වියදම පමණක් හඳුනාගත යුතු වුවද ,වර්ෂයේ ජාතිය ගොඩනැගීමේ බදු වියදම වූ රු. 14,728,700 ක ප්‍රමාණය තුළ ගනුදෙනුකරුවන්ගෙන් එකතු කර ගත් බදු මුදල් ද ඇතුළත් කර තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට කෙටිකාලීන ණය ශේෂය රු. 494,970,217 ක් වුවත් ඒ සඳහා ගෙවිය යුතු ණය පොළී ප්‍රමාණය ගණනය කර මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබුණි.

(ඇ) විගණනය වෙත ඉදිරිපත් කළ තොරතුරු අනුව ගිවිසුම්ගත දිනයන්ට නිමකර භාර දී නොතිබුණු මුද්‍රණ කාර්යයන් වෙනුවෙන් සමාලෝචිත වර්ෂය සඳහා ගිවිසුමේ කොන්දේසි අනුව අයකළ හැකි දඩ හා ප්‍රමාද ගාස්තුව රු. 48,472,330 ක් වුවද ඒ සඳහා රු. 23,449,201 ක ප්‍රතිපාදනයක් පමණක් සිදුකර තිබුණි. එසේම ඉහත ප්‍රතිපාදනය ණයගැතියන්ගෙන් අඩුකිරීමට කටයුතු නොකර විකුණුම් වලින් අඩුකර දක්වා තිබුණි.

(ඈ) සමාලෝචිත වර්ෂයේ දී විගණන ගාස්තු සඳහා ප්‍රතිපාදන සලසා නොතිබුණි.

## 2.2.4 නොසැසඳු පාලන ගිණුම්

-----------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) විකුණුම් රැස්කිරීමේ ගිණුමේ රු.1,443,477 ක බැර ශේෂය, විකුණුම් පාලන ගිණුම හා සැසඳීම් කර නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

(ආ) පාසල් පෙළපොත් සඳහා සමාලෝචිත වර්ෂයේ දී නිකුත්කර තිබූ ඉන්වොයිස් වටිනාකම හා ලෙජර් ගිණුම් අනුව අදාළ පෙළපොත් ආදායමේ රු. 48,907,179 ක වෙනසක් නිරීක්ෂණය විය.

## 2.2.5 විගණනය සඳහා සාක්ෂි නොවීම

----------------------------------

පහත සඳහන් එක් එක් විෂය ඉදිරියෙන් දක්වා ඇති සාක්ෂි විගණනයට ඉදිරිපත් නොකෙරුණි.

| | විස්තරය | වටිනාකම | ඉදිරිපත් නොකල සාක්ෂි |
|---|---|---|---|
| | --------- | ---------------- | ---------------------------- |
| | | රු | |
| (අ) | වෙළඳ ණයගැතියෝ | 282,283,756 | ශේෂ සනාථ කිරීම් |
| (ආ) | දඩ මුදල් ගැලපීම | 5,460,991 | විකුණුම්වලට අදාල ඉන්වොයිස් පත්‍ර |

| | | | |
|---|---|---|---|
| (ඈ) | අලෙවි ප්‍රවර්ධන වැඩසටහන් | 236,250 | වැඩ සටහන් විස්තර |
| (ඈ) | වෙළඳ ණයහිමියන් | 946,480 | ශේෂ සනාථ කිරීම |
| (ඉ) | අවිනිශ්චිත ගිණුම (වියදම්වලට ගැලපීම) | 4,436,636 | වියදමක් ලෙස හඳුනාගෙන ආදායමට ලියාහැරීමට අදාළ විස්තර |

## 2.3 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සංස්ථාවේ ණය අයකර ගැනීමේ අකාර්යක්ෂමතාව හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ ආරම්භක ණය ශේෂය වූ රු. 750,607,688 ක ප්‍රමාණය සමාලෝචිත වර්ෂය අවසානයේදී රු. 809,256,090 ක් දක්වා සියයට 8 ක ප්‍රතිශතයකින් වර්ධනය වී තිබුණි. මෙකී වෙළඳ ණයගැතියන්ගෙන් රු. 36,029,161 ක් වර්ෂ 01 කට වැඩි කාලයක සිටද, රු.65,443,837 ක් වර්ෂ 2 ත් 4 ත් අතර කාලයක සිටද අයනොවී පැවති අතර වර්ෂ 05 ඉක්ම වූ ණයගැති ශේෂය රු.43,453,396 ක් විය.

(ආ) සංස්ථාවේ අභ්‍යාස පොත් අලෙවිකිරීම සඳහා 2010 වර්ෂයේ සිට පත්කර තිබුණු අලෙවි නියෝජිතයෙකුගෙන් සමාලෝචිත වර්ෂය අවසානය දක්වා අයවීමට තිබුණු ණය මුදල රු. 5,747,194 ක් විය. මෙම ණය ලබාදීම සම්බන්ධව නියෝජිතයාගෙන් ඇපකර ලබාගෙන නොතිබූ අතර හිටපු සභාපතිවරයාගේ නියෝග පරිදි ණය ලබාදී තිබුණි. ඇපකර රහිතව ණය පදනම මත අභ්‍යාස පොත් අලෙවිකිරීමේදී ද අත්පිට මුදලට භාණ්ඩ විකිණීමේදී ලබාදෙන සියයට 40 ක වට්ටමද ලබාදී තිබුණි.

(ඇ) අනුරාධපුර අලෙවිසැලෙහි 2012 වර්ෂයේ සිට අයකර ගතයුතු රු.5,491,302 ක ණයගැති ශේෂය 2015 මැයි 30 දක්වාම පියවා නොතිබුණි. මෙකී ණය මුදල , ණය ලබාදීමේ පරිපාටියෙන් බැහැරව හිටපු සභාපතිවරයාගේ වාචික උපදෙස් මත ණය ලබා දී තිබුණ

අයකර ගැනීම සම්බන්ධව නීතිමය පියවර ගෙන නොතිබුණි.

(ඇ) විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් වලදීද ණය පදනම මත අලෙවි කරනු ලබන අභ්‍යාස පොත්වල ණය මුදල් කඩිනමින් අයකර ගැනීමට කටයුතු කළයුතු බව හා ඒ පිළිබඳ විධිමත් ක්‍රමවේදයක් සකස්කිරීමට යෝජනා කර තිබුණද ඒ අනුව කටයුතු කර නොතිබුණි.

(ඉ) ජාතික කඩදාසි සමාගමෙන් අයවිය යුතු වර්ෂ 01 කට පැරණි ණය ශේෂය රු.7,989,976 ක් වී තිබුණි.

(ඊ) ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයෙන් අයවීමට තිබුණු රු. 1,818,829 ක මුදලක් අයකර ගැනීම අවිනිශ්චිත තත්ත්වයක පැවතුණි.

(උ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ගෙවිය යුතු ණය ශේෂය රු.59,781,032 ක් වූ අතර ණයහිමි කාල විශ්ලේෂණයට අනුව වසර 2 ත් 5 ත් අතර බේරුම් නොකරන ලද ණයහිමියන්ගේ වටිනාකම රු. 22,927,868 ක් විය. මෙය මුළු ණයහිමියන්ගේ වටිනාකමෙන් සියයට 39 ක් වී තිබුණි.

(ඌ) පසුගිය වර්ෂයන්ට අදාළව දේශීය ආදායම් දෙපාර්තමේන්තුව වෙත ගෙවිය යුතු ආදායම් බදු රු72,813,671 ක් සංස්ථාව විසින් 2015 මැයි 29 දින වනවිටත් ගෙවීමට කටයුතු කර නොතිබුණි.

## 2.4 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

පහත සඳහන් නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම් විගණනයේදී නිරීක්ෂණය විය.

| | නීති, රීති හා රෙගුලාසිවලට යොමුව | අනුකූල නොවීම |
|---|---|---|
| | -------------------------------- | ------------------- |
| (අ) | 2002 අංක 14 දරන එකතුකළ අගය මත බදු පනතේ 26 (1) උපවගන්තිය | 2009 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂයේ අවසානය දක්වා ගනුදෙනුකරුවන්ගෙන් එකතුකර දේශීය ආදායම් දෙපාර්තමේන්තුව වෙත ප්‍රේෂණය කළයුතු රු. 98,399,136 ක් 2015 ජුනි 30 දින දක්වාම ප්‍රේෂණය කර නොතිබුණි. |
| (ආ) | 2009 අංක 09 දරන ජාතිය ගොඩනැගීමේ බදු පනතේ 4 වන වගන්තිය | 2009 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය දක්වා ගනුදෙනුකරුවන්ගෙන් එකතුකර දේශීය ආදායම් දෙපාර්තමේන්තුව වෙත ප්‍රේෂණය කළයුතු රු. 68,705,093 ක් 2015 ජුනි 30 දින දක්වාම ප්‍රේෂණය කර නොතිබුණි. |
| (ඇ) | 2007 අංක 07 දරන සමාගම් පනත | හිටපු සංස්ථා සභාපතිවරයාගේ පෞද්ගලික සහකාරවරයකු විසින් පෞද්ගලික සමාගමක් පිහිටුවාගෙන සංස්ථාව සමග ගනුදෙනුකර තිබුණි. මෙසේ ගනුදෙනු කිරීමේදී සමාගම් පනතට අදාළව නිසි පරිදි සමාගම වෙනුවෙන් කටයුතු කිරීමට බලය පවරා නොතිබුණු පුද්ගලයෙකුගෙන් රු. 46,566,658 ක් වටිනා කඩදාසි සංස්ථාව මිලට ගෙන තිබුණි. |

| | | |
|---|---|---|
| (ඈ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | සභාපතිවරයාගේ නිල රථයට අවශ්‍ය උපකරණ මිලදී ගැනීම් සඳහා 2013 අප්‍රේල් 11 දින ලබා දී තිබුණු රු.1,050,000 ක්වූ අත්තිකාරම් මුදල 2015 ජුනි 30 දින දක්වාම පියවා නොතිබුණි. |
| (ඉ) | 2011පෙබරවාරි 09 දිනැති අංක 13/2008 (IV) දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය | නිළධාරීන් හතර දෙනෙකු සඳහා අනුමත සීමාව ඉක්මවා නිල වාහන වෙනුවෙන් ඉන්ධන සඳහා රු. 1,530,113 ක් ගෙවා තිබුණි. |
| (ඊ) | 2003 ජුනි 02 දිනැති අංක PED/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 8.3.5 වගන්තිය | හිටපු සභාපතිවරයා සඳහා ලබා දී තිබූ වාහනයට අමතරව තවත් වාහන 02 ක් සමාලෝචිත වර්ෂයේ ජූලි මාසය දක්වා භාවිතා කර තිබුණි. |

## 2.5 මතභේදයට තුඩුදෙන ගනුදෙනු

**පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.**

(අ) සමාලෝචිත වර්ෂයේ දැයට කිරුළ (කුලියාපිටිය ) ප්‍රදර්ශන වෙළඳ කුටිය ජනමාධ්‍ය අමාත්‍යාංශය මගින් නිර්මාණය කර දී තිබියදී වෙළඳ කුටිය ඇතුළත නිමවුම් කටයුතු සඳහා පමණක් රු. 2,130,576 ක වියදමක් සංස්ථාව විසින් වැයකර තිබීම විගණනයේදී සෑහීමට පත්විය නොහැක.

(ආ) සංස්ථාව විසින් 2013 දෙසැම්බර් 31න් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සඳහා රු.820,000 ක මුදලකට පෞද්ගලික විගණන ආයතනයක් වෙත භාරදී තිබුණි. ගණකාධිකාරිවරුන් තිදෙනෙකුගේ අධීක්ෂණයකින් යුත් 50 දෙනෙකුට අධික කාර්ය මණ්ඩලයක් ගිණුම් අංශයේ සිටියදී බාහිර ආයතනයක් වෙත මෙම කාර්ය පැවරීම මතභේදයට තුඩුදෙන කරුණක් බව නිරීක්ෂණය විය.

(ඇ) උපයන විට ගෙවීම් බදු රු. 994,201 ක් සේවකයින්ගෙන් අය නොකර සංස්ථාව විසින් ගෙවා තිබූ අතර මෙය මෙහෙයුම් වියදම් යටතේ ගිණුම්ගත කර තිබුණි

## 3. මූල්‍ය සමාලෝචනය

---

### 3.1 මූල්‍ය ප්‍රතිඵල

---

සමාලෝචිත වර්ෂය තුළ සංස්ථාවේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.71,153,661 ක බදු පූර්ව ශුද්ධ ලාභයක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂය සඳහා බදු පූර්ව ශුද්ධ ලාභය රු.78,095,872 ක් වූයෙන් ඉකුත් වර්ෂය හා සැසඳීමේදී සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.6,942,211 ක පිරිහීමක් නිරීක්ෂණය විය. ඉකුත් වර්ෂය හා සැසඳීමේදී සමාලෝචිත වර්ෂයේ විකුණුම් ආදායම රු.97,134,411 කින් වර්ධනය වී තිබුණද වර්ෂයේ විකුණුම් පිරිවැය රු. 77,015,131 කින් හා වර්ෂයේ වියදම් රු.28,711,539 කින් වැඩි වී තිබීම මෙම පිරිහීමට ප්‍රධාන හේතු වී තිබුණි.

### 3.2 ණය උපයෝජනය

---

සමාලෝචිත වර්ෂය තුළදී රාජ්‍ය බැංකුවකින් ලබාගෙන තිබුණු කෙටිකාලීන ණය ප්‍රමාණය රු. 601,781,294 ක් වූ අතර ඉන් රු.494,970,217 ක් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31දින වන විටත් පියවා නොතිබුණි. නියමිත දිනට ණය නොගෙවීම නිසා ගෙවීමට සිදු වූ අමතර පොළියද ඇතුළුව රු.53,633,209 ක් ණය පොලී ලෙස සමාලෝචිත වර්ෂයේදී ගෙවා තිබුණි.

### 3.3 කාරක ප්‍රාග්ධන කළමනාකරණය

---

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සංස්ථාව විසින් බැංකු ගිණුම් 03 ක් පවත්වා ගෙන යනු ලබන අතර එක් බැංකුවකින් ලබාගත් බැංකු අයිරා පහසුකම් වෙනුවෙන් සමාලෝචිත වර්ෂයේදී රු.4,700,100 ක පොළියක් ගෙවීමට සිදුව තිබුණි. සංස්ථාවේ කාරක ප්‍රාග්ධන තත්ත්වය පිරිහීම හේතුවෙන් වාර්ෂිකව කෙටිකාලීන බැංකු ණය ලබාගැනීමේ වර්ධනයක් ඇති වී තිබුණු අතර මෙම හේතුව නිසා සමාලෝචිත වර්ෂයේ පොළී ආවරණ අනුපාතය මෙහෙයුම් ලාභය සමග සැසඳීමේ දී සියයට 49 ක් විය.

(ආ) ක්ෂණික වත්කම් තුළ ඇතුළත් ජංගම වත්කම් වලින් සියයට 82 ක් වෙළඳ ණයගැතියන්ගෙන් සමන්විත වන අතර එම ප්‍රමාණයෙන් රු. මිලියන 92 ක් වර්ෂයකට වැඩි කාලයක සිට අයනොවී පැවතුණි. කඩිනමින් ණය අයකර සංස්ථාවේ ද්‍රවශීලතාවය

ඉහල නැංවිය හැකි උපාය මාර්ග පිළිබඳ කළමනාකරණයේ අවධානය යොමුවී නොතිබුණි.

## 4. මෙහෙයුම් සමාලෝචනය

## 4.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

සංස්ථාවේ නිෂ්පාදන කටයුතුවලට අදාල තොග මට්ටම් තීරණය කර ඒ අනුව නිෂ්පාදනයට බාධා නොවන පරිදි කාර්යක්ෂම තොග පාලනයක් සිදුකිරීම කෙරෙහි කළමනාකරණයේ අවධානය යොමුකර නොතිබුණි. මෙම නිසා කාලීනව අවශ්‍ය නොවන හා සෙමින් චලනය වන තොගවල සංස්ථාව ආයෝජනය කර තිබුණු මුදල රු. මිලියන 231 ක් විය. මෙසේ පාලනයකින් තොරව තොගවල මුදල් ආයෝජනය කිරීම හේතුවෙන් සංස්ථාවට ගෙවීමට තිබූ කෙටිකාලීන ණය රු. මිලියන 494 දක්වා වැඩිවී තිබුණි.

## 4.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂය සඳහා සංස්ථාවේ සමස්ත අලෙවි කටයුතු සඳහා අලෙවිකරණ සැලැස්මක් සකස් කර නොතිබූ අතර අභ්‍යාස පොත් සහ ලිපිද්‍රව්‍ය අලෙවි ඉලක්කයන් දැක්වෙන සැලැස්මක් පමණක් සකස් කර තිබුණි.

(ආ) සංස්ථාව ලියන කඩදාසි ඇනවුම් කිරීමේ දුර්වලතා හේතුවෙන් සමාලෝචිත වර්ෂය තුළ අභ්‍යාස පොත් නිෂ්පාදන කටයුතුවලට බාධා ඇතිවීමෙන් පෙර වර්ෂයට සාපේක්ෂව අභ්‍යාස පොත් නිෂ්පාදනය ඒකක 1,698,537 කින් එනම් වටිනාකම රු. 29,700,420 කින් අඩුවී තිබුණි. කාලීනව වෙළඳපල අවශ්‍යතා හඳුනාගෙන අභ්‍යාස පොත් නිෂ්පාදන කටයුතු සිදුනොකිරීම හේතුවෙන් පාරිභෝගික ඉල්ලුම සපුරාලීමට සංස්ථාව අපොහොසත් වී තිබුණු බව ගබඩා තොග ලේඛන හා තොග ඇනවුම් ලේඛන පරීක්ෂාවේදී අනාවරණය විය. ඒ හේතුවෙන් වෙළඳපල අවශ්‍යතා නිසිපරිදි සපුරාලීමට නොහැකි වීමේ තත්ත්වය තුළ සංස්ථාවේ වෙළඳපල කොටස සහ විකුණුම් ආදායම අඩුවීමේ ප්‍රවණතාවයක් උද්ගත වී තිබුණි.

(ඇ) සංස්ථාව විසින් ප්‍රධාන කාර්යාලයක් හා අලෙවි අංශයක් ඉදිකිරීම සඳහා, පර්චස් 27 ක ඉඩමක් බදු පදනම මත ලබා ගැනීම සඳහා 2013 වර්ෂයේදී, අත්තිකාරම් වශයෙන්

රු. 1,000,000 ක මුදලක් රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ පූර්ව අනුමැතියකින් තොරව හා මූල්‍යමය ශක්‍යතා අධ්‍යයනයක් සිදු නොකර නාගරික සංවර්ධන අධිකාරිය වෙත ගෙවා තිබුණි. මෙම ව්‍යාපෘතිය අත්හැර දැමීම හේතුවෙන් ගෙවන ලද අත්තිකාරම් නැවත අයකර ගැනීමට නොහැකි වී තිබුණි.

(ඈ) සමාලෝචිත වර්ෂයේ නිෂ්පාදන සැලැස්මට අනුව රු. මිලියන 730 කින් පාසල් පෙළ පොත් මිලියන 9.13 ක් නිෂ්පාදනය කිරීමට සැලසුම් කර තිබුණද වර්ෂයේ තථ්‍ය පෙළපොත් නිෂ්පාදනය රු. මිලියන 1.9 කින් අඩු වී තිබුණි. එසේවුවත් නිෂ්පාදන පිරිවැය රු. මිලියන 31 කින් වැඩි වී තිබුණි.

(ඉ) ගිවිසුම්ගත වටිනාකම රු. මිලියන 428.8 ක් වූ පාසල් පෙළපොත් සහ රු. මිලියන 3.96 ක ගුරු අත්පොත් අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුවට භාර දී තිබුනේ දින 49 ක කාල ප්‍රමාදයකිනි. මෙම ප්‍රමාදයන් නිසා සමාලෝචිත වර්ෂයේ දී පමණක් රු. මිලියන 48 ක් ප්‍රමාද ගාස්තු ලෙස සංස්ථාවට ගෙවීමට සිදුවී තිබුණද පෙළපොත් නිෂ්පාදනයේ කාර්යක්ෂමතාවය ඉහළ නැංවීමේ අවශ්‍යතාවය කෙරෙහි අවධානය යොමු වී නොතිබුණි.

### 4.3 නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්

-----------------------------------------

සමාලෝචිත වර්ෂය අවසානයේ හානි වූ හා චලනය නොවන තොග වටිනාකම පිළිවෙලින් රු. 1,226,224 ක් හා රු.154,741 ක් වූ අතර මෙම තොග ඉවත් කිරීමට හෝ සුදුසු ක්‍රියාමාර්ග ගැනීම කෙරෙහි අවධානය යොමු කර නොතිබුණි.

### 4.4 කොන්ත්‍රාත් පරිපාලනයේ අඩුපාඩු

--------------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ජන හා සංඛ්‍යා ලේඛණ දෙපාර්තමේන්තු පත්‍රිකා බෙදාහැරීමට අවශ්‍ය කාඩ්බෝඩ් පෙට්ටි සැපයීමේ කොන්ත්‍රාත්තුව වැට් සහිත වටිනාකම රු. 7,067,905 ක් වූ මුදලකට පෞද්ගලික ආයතනයකට පවරා තිබුණි . ප්‍රසම්පාදනය සඳහා විධිමත් පරිදි මිල කැඳවීමකින් තොරව හා පෙට්ටියක වෙළඳපොලේ පවතින මිල වූ රු. 25 ක මුදලට මිලට

ගැනීමට කටයුතු නොකර පෙට්ටියක් රු.66 ක් බැගින් මිලට ගැනීම හේතුවෙන් සංස්ථාවට රු. 1,508,390 ක අලාභයක් සිදුවී තිබුණි.

(ආ) ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 7.9.1 වගන්තියට අනුව අවම මිල සහිත ලංසුව තෝරාගතයුතු වුවද එයට පටහැනිව උපරිම හතරවන මිල ඉදිරිපත් කර තිබූ උක්ත ආයතනයට ප්‍රසම්පාදනය පිරිනමා තිබීම හේතුවෙන් රු.864,500 ක අලාභයක් සංස්ථාව සිදුවී තිබුණි.

(ඇ) සුදු ලියන කඩදාසි මෙ.ටො 650 ක් මිලදී ගැනීම සඳහා තාක්ෂණික කමිටුව විසින් ඇගයීමක් සිදුකර නොතිබියදී මෙම මිලදී ගැනීම සඳහා දෙවන උපරිම මිල ඉදිරිපත් කර තිබූ ආයතනයට ලංසුව පිරිනමා තිබුණි. අවම මිල සහිත සැපයුම්කරු තෝරා නොගැනීම නිසා රු. 860,600ක අලාභයක් සංස්ථාවට සිදුවී තිබුණි.

**4.5 වෙනත් රාජ්‍ය ආයතන වෙත ලබාදුන් සංස්ථාවේ සම්පත්**

-----------------------------------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සංස්ථාවේ සේවකයින් දස දෙනෙකු ජනමාධ්‍ය හා ප්‍රවෘත්ති අමාත්‍යාංශයට හා නිපුණතා සංවර්ධන අමාත්‍යාංශයට මුදාහැර තිබුණු අතර වැටුප්, අතිකාල සහ අනිකුත් දීමනා ඇතුලත්ව සමාලෝචිත වර්ෂයේදී රු. 3,731,108 ක් සංස්ථාව විසින් ගෙවා තිබුණි. මෙම සේවකයින්ගෙන් 07 දෙනෙකුම සංස්ථා සේවයට බඳවාගත් දිනයේදීම ජනමාධ්‍ය හා ප්‍රවෘත්ති අමාත්‍යාංශය සඳහා මුදාහැර තිබුණි. නිපුණතා සංවර්ධන අමාත්‍යාංශයට මුදාහැර ඇති සේවකයින් පිළිබඳ කිසිදු තොරතුරක් සංස්ථාවට ඉදිරිපත් කර නොතිබුණු අතර කිසිදු අධීක්ෂණයකින් තොරව දිගින් දිගටම වැටුප් ගෙවා තිබුණි.

(ආ) සංස්ථාව සතු ඉඩම් ප්‍රමාණය වූ අක්කර 48 න් අක්කර 13යි රූඩ් 2යි පර්චස් 06ක් කාර්මික ජනපදයක් සඳහා ලබා දී තිබුණද පැවරුම්ලාභියා පිළිබඳ විස්තර විගණනයට ඉදිරිපත් නොකෙරුණි.

## 4.6 කාර්ය මණ්ඩල පරිපාලනය

-------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2014 දෙසැම්බර් 31 දිනට අනුමත තනතුරු සංඛ්‍යාව 686 ක් වුවත් තථ්‍ය සංඛ්‍යාව 578 ක් වීමෙන් පුරප්පාඩු තනතුරු සංඛ්‍යාව 108 ක් විය. එම පුරප්පාඩු පිරවීමට කටයුතු නොකර සේවකයින් 90 ක් පුරප්පාඩු නොමැති සේවා කාණ්ඩයන්ට අනුමැතියකින් තොරව බඳවා ගෙන තිබුණි.

(ආ) අනුමත සේවක සංඛ්‍යාවෙන් බැහැරව අනියම් පදනම මත සේවකයකුද කොන්ත්‍රාත් පදනමට සේවකයින් 21 ක්ද තාවකාලික පදනම මත සේවකයින් 12 ක්ද ලෙස සේවකයින් 34 ක් බඳවාගෙන තිබුණි.

(ඇ) 2009 ජුනි 01 දිනැති කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 30 හි අන්තර්ගත රාජ්‍ය මුද්‍රණ නීතිගත සංස්ථාවේ කාර්යමණ්ඩලයට ඇතුළත් නොවූ හා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ විධිමත් අනුමැතියකින් තොරව (HM 1-1 ) මෙහෙයුම් කළමනාකරු හා (MA3) ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ නිලධාරී යන නව තනතුරු ඇතිකරගෙන නිලධාරීන් බඳවාගෙන තිබුණි.

## 4.7 වාහන උපයෝජනය

----------------------

රාජ්‍ය මුද්‍රණ නීතිගත සංස්ථා පනතට අනුව නීත්‍යානුකූල නොවූ උපසභාපති තනතුර සඳහා නිලධාරියෙකු පත්කර ඔහු වෙනුවෙන් කුලී පදනම මත ලබා ගත් වාහනය සඳහා රු.731,625 ක් ද, ප්‍රවාහන පහසුකම් ලබාගැනීමට හිමිකම් නොමැති නිලධාරීන් දෙදෙනෙකු වෙනුවෙන් ඉන්ධන හා ප්‍රවාහන දීමනා ලෙස රු. 1,215,464 ක්ද සංස්ථාව විසින් ගෙවා තිබුණි.

## 5 ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය

----------------------------------------

### 5.1 ප්‍රසම්පාදන සැලැස්ම

-----------------------

ප්‍රසම්පාදන සැලැස්මක් සකස්කර තිබුණද ප්‍රසම්පාදන මාර්ගෝපදේශ වලින් බැහැරව කටයුතු කළ අවස්ථා හා වර්ෂය තුළ විධිමත් තොග පාලන ක්‍රමයක් අනුගමනය නොකිරීම හේතුවෙන් ප්‍රසම්පාදන සැලැස්මට අනුව කටයුතු කිරීමට නොහැකිවීම නිසා ප්‍රසම්පාදන සැලැස්ම ඵලදායී පාලන කාරකයක් ලෙස උපයෝගී කරගැනීමට කළමනාකරණය අපොහොසත් වී තිබුණු බව නිරීක්ෂණය විය.

### 5.2 අයවැය ලේඛනමය පාලනය

--------------------------------

අයවැය ගත හා තථ්‍ය ශේෂ අතර සැලකිය යුතු වෙනස්කම් නිරීක්ෂණය වූයෙන් අයවැය ලේඛනය ඵලදායී කළමනාකරණ පාලන කාරකයක් ලෙස යොදාගෙන නොතිබුණු බව නිරීක්ෂණය විය.

## 6. පද්ධති හා පාලනයන්

-----------------------

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන දුර්වලතා සංස්ථාවේ සභාපතිවරයා වෙත වරින්වර දන්වා යවන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතු වේ.

(අ) ගිණුම්කරණය

(ආ) ණයගැතියන් පාලනය

(ඇ) ප්‍රසම්පාදනය

(ඈ) මූල්‍ය කළමනාකරණය

(ඉ) වාහන උපයෝජනය

(ඊ) සේවක මණ්ඩල කළමනාකරණය

(උ) තොග පාලන

ඩබ්ලිව්.පී.සී.වික්‍රමරත්න

විගණකාධිපති (වැඩබලන)

## 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම්

### 2.2.1 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති

(අ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති අංක 01

වත්කම් හා වගකීම් එකිනෙකට හිලව් කිරීමක් සිදු නොකර මින් ඉදිරියට මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීමට කටයුතු කරනු ඇත.

(ආ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති අංක 02

ඉදිරි වර්ෂවලදී අවසන් තොගවල ශුද්ධ උපලබ්ධි අගය ගණනය කිරීමේ විස්තර අවසන් තොග සත්‍යාපන පත්‍රිකා සහ අනෙකුත් අදාළ ලේඛනවල පෙන්නුම් කිරීමට කටයුතු යොදනු ඇත.

(ඇ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති අංක 07

මුදල් ප්‍රවාහ ප්‍රකාශය පිළියෙල කිරීමේ දී මූල්‍ය ගිණුම්වලට විවිධ ගැලපීම් කිරීමට සිදුවේ. උදාහරණ ලෙස මෙහෙයුම්වලින් ජනිත වූ අරමුදල් ගලා ඒම ගණනය කිරීමේ දී ක්ෂය කිරීම් නැවත මූල්‍ය ලාභයට එකතු කරනු ලැබේ. එබැවින් අනෙකුත් ගැලපීම්වල ශුද්ධ වටිනාකම මෙලෙස පෙර වර්ෂයට අදාළ ගැලපීම් ලෙස මෙහෙයුම්වලින් ජනිත වූ අරමුදල් වලට ගලපන ලදී. එසේ වුව ද හැකිතාක් දුරට අදාළ ප්‍රමිතීන්ට අනුව කටයුතු කිරීමට සැලසුම් කර ඇත.

(ඈ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති අංක 08

2014 වර්ෂය වන තෙක් ශ්‍රී. ලං. ගි. ප්‍ර. අංක 08 අනුව අතීතානුයෝගීව මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයට ගැලපීම් සිදුකරනු නොලැබූ අතර, 2015 වර්ෂය සඳහා ඉදිරිපත් කරනු ලබන මූල්‍ය ප්‍රකාශනවල සිට මෙම ගැලපීම් කිරීමට අවශ්‍ය පියවර ගනු ලැබේ.

(ඉ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති අංක 12

ඉහත ප්‍රමිතිය අනුව අවශ්‍ය අනාවරණයන් ඉදිරියේ දී සිදු කිරීමට කටයුතු කරනු ලැබේ.

(ඊ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති අංක 16

සම්පූර්ණයෙන් ක්ෂය කර තිබූ එහෙත් තවදුරටත් භාවිතයට ගනු ලබන වත්කම්වල මූල්‍ය වටිනාකම් හා ප්‍රතිශත පිළිබඳ සුදුසු අනාවරණයන් සිදු කර තිබූ අතර, ණය ලබා ගැනීමේ දී ලබා දී තිබූ සියලු ඇප සම්බන්ධයෙන් ඉදිරි වර්ෂවල සිට හෙළිදරව් කිරීමට කටයුතු යොදා ඇත.

(උ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති අංක 19

ඉදිරි වර්ෂවල සිට අදාළ අනාවරණයන් සිදුකිරීමට කටයුතු යොදා ඇත.

(ඌ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති අංක 23

2014 වර්ෂය සඳහා මෙවැනි වියදම් හඳුනාගත නොහැකි වූයේ, වසර තුළ දී කරන ලද සෑම ණය ගැනීමක්ම අමුද්‍රව්‍ය ආනයනය වෙනුවෙන් කරන ලද නිසා හා ඒවා ප්‍රාග්ධනික කළහොත් එය අතාත්වික වන බැවිනි.

(එ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති අංක 24

ඉහත ප්‍රමිතියන්ට අදාළ අනාවරණයන් ඉදිරි වර්ෂවල සිට පැහැදිලි කිරීමට කටයුතු යොදා ඇත.

(ඒ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති අංක 39

ණයගැතියන් පිළිබඳ වාර්තා කිරීම් ඉහත ප්‍රමිතියට අනුව කිරීමට කටයුතු යොදා ඇත.

### 2.2.2 ගිණුම්කරණ ප්‍රතිපත්ති

රේඛීය අමාත්‍යාංශයේ ද උපදෙස් පරිදි, අයකර ගැනීමේ හැකියාවක් නොමැති ණය පිළිබඳ විධිමත් විශ්ලේෂණයක් මේ වන විට සිදුකර ගෙන යනු ලබන අතර, ඒ අනුව 2015 වසරේ දී බොල් සහ අඩමාන ණය ලෙස කපා හැරිය යුතු ප්‍රමාණය නිවැරදිව තීරණය කිරීමට කටයුතු යොදනු ලැබේ.

### 2.2.3 ගිණුම්කරණ අඩුපාඩු

(අ) 2014 වර්ෂය තුළ ගෙවිය යුතු ජාතිය ගොඩනැගීමේ බදු වියදම වූ රු. 14,728,700/= නිවැරදිව බැරකමක් ලෙස පෙන්නුම් කර ඇත.

(ආ) මේ වනතුරු වර්ෂ අවසානයේ පැවති කෙටිකාලීන ණය ශේෂය සඳහා උපචිත පොලිය ගණනය නොකරන ලද අතර, 2015 වසරේ පටන් එලෙස ගණනය කොට ගිණුම්ගත කිරීමට පියවර ගනු ලැබේ.

(ඇ) 2014 වර්ෂයේ දී ප්‍රථම වරට පෙළ පොත් හා ගුරු අත්පොත් සඳහා ප්‍රමාද දඩ වෙනුවෙන් ගිණුම්වල ප්‍රතිපාදනයක් සිදු කරන ලද්දේ පසුගිය වසරවල අයකර තිබූ දඩ මුදල්වල සාමාන්‍ය පදනම් කරගෙනය. මෙහි සඳහන් ඌණ ප්‍රතිපාදනයට අදාළ දඩ මුදල් 2014 වසර වෙනුවෙන් වූ එහෙත් 2015 වසරේ දී නිරවුල් කරන ලද ඉන්වොයිස් පත්වලින් අඩු කරනු ලැබ ඇති බැවින් අදාළ ගැලපීම් සිදුකළ හැක්කේ 2015 වසරේ දීය.

(ඈ) 2012, 2013 වර්ෂයන් සඳහා විගණන ගාස්තු ඉල්ලුම් කර නොතිබුණු බැවින්, 2014 වර්ෂය සඳහා විගණන ගාස්තු සඳහා ප්‍රතිපාදනයක් සිදු නොකරන ලදී. එසේ වුව ද ඉදිරියට ගෙන ආ උපචිත වියදම්වල ප්‍රමාණවත් ප්‍රතිපාදන විගණන ගාස්තු සඳහා වෙන් කර ඇත.

### 2.2.4 නොසැසඳූ පාලන ගිණුම්

(අ) 2015 වසරේ දී මෙය නිරවුල් කර ඇත.

(ආ) 2015 වසරේ දී මෙම වෙනස්කම් නිවැරදි කර තිබේ.

### 2.2.5 විගණනය සඳහා සාක්ෂි නොවීම

(අ) වෙළඳ ණයගැතියෝ

ඉදිරියේ දී සියලු ණයගැතියන් සඳහා ශේෂ සනාථ කිරීමේ ලිපි ඉදිරිපත් කිරීමට කටයුතු යොදා ඇත.

(ආ) දඩ මුදල් ගැළපීම

මීට අදාළ ඉන්වොයිස්පත් වසර 4කට වඩා පැරණි නමුදු ඒවා විගණනය සඳහා ලබාගත හැක.

(ඇ) අලෙවි ප්‍රවර්ධන වැඩසටහන්

එවකට සිටි සභාපතිතුමාගේ උපදෙස් පරිදි වාහන 03ක් පොළොන්නරුව, ත්‍රිකුණාමලය සහ මඩකලපුව යන දිස්ත්‍රික්කවල අලෙවි ප්‍රවර්ධන කටයුතු සඳහා යොදවා ඇත. එහි දුර උපරිම සීමාව කි.මී. 2100 ලෙසත් ඒ සඳහා එක් වාහනයකට මාසික කුලිය රු. 78,750.00ක් වශයෙන් වාහන 03ක් ලබාගෙන ඇත.

(ඈ) වෙළඳ ණය හිමියන්

ණයහිමියන්ට අදාළ ශේෂ තහවුරු කිරීමේ ලිපි සියල්ල විගණනයට ඉදිරිපත් කරන ලද අතර, ඒ පිළිබඳ සාරාංශයක් ඇතුළත් සටහනක් 2015.05.20 වන දින විගණන නිලධාරියාට ෆැක්ස් පණිවුඩයක් මගින් දන්වා ඇත.

(ඉ) අවිනිශ්චිත ගිණුම

මූල්‍ය වර්ෂය අවසානයේ දී අවිනිශ්චිත ගිණුම ගැළපී ඇත. එබැවින් මූල්‍ය ප්‍රකාශනවලින් අනාවරණය වීමක් අවශ්‍ය නොවේ. සාක්ෂි නොමැති / ලියකියවිලි නොමැති රු. 4,436,636ක් නැවත ලාභයට එක්කර අදාළ බැරකම 2015 වසරේ දී කපා හරිනු ඇත. ඉදිරියේ දී සියලු ණය හිමියන් වෙත ශේෂ සනාථ කිරීමේ ලිපි යැවීමට කටයුතු යොදා ඇත.

## 2.3 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

(අ) 2013 වර්ෂයේ ණයගැති ශේෂය රු. 750,607,688/= ක් වන අතර, 2014 එය රු. 809,256,090/= වේ. එය රු. 58,648,402/= ක වැඩිවීමකි. (7.8%) එසේම 2014 වර්ෂයේ ආදායම රු. 1,334,036,310/= කි. 2013 වර්ෂයේ ආදායම රු. 1,236,901,899/= කි. එනම් වැඩිවීම 97,134,411 කි. එය ප්‍රතිශතයක් ලෙස 7.85%කි.

සියලුම මුද්‍රණ කටයුතු හා අලෙවිසැල්වලින් 70%ණය ඉන්වොයිස් මත ආදායම් ලබන මෙම සංස්ථාවට පසුගිය වසරට වඩා ආදායම් වැඩි වී ණයගැති ශේෂය වැඩි වී තිබුණි. 2012 වසරේ සිට වෙනම ගණකාධිකාරීවරයෙකු යටතේ ණය අයකර ගැනීම ක්‍රමවත්ව හා කාර්යක්ෂම ලෙස ඉටු කිරීමට කටයුතු යොදා ඇත.

(ආ) එවකට සිටි සභාපතිවරයාගේ සෘජු මැදිහත් වීම මත අයි. ජී. ඒ. බණ්ඩාර මහතාට අලෙවි නියෝජිත තනතුර ලබා දී ඇත. මිලදී ගැනීමේ දී ඇති වූ තොග ඌණතා හෝ වෙනත් දුෂ්කරතා මත ණයට හා අත්පිට මුදලට 40%ක ස්ථාවර වට්ටම් ප්‍රතිශතයක් ලබාදී තිබුණි.

(ඇ) මෙම ණය මුදල සම්බන්ධයෙන් සාමාන්‍යාධිකාරී විසින් 2014.03.06 දින කොළඹ අපරාධ විමර්ෂණ ඒකකයට පැමිණිල්ලක් ඉදිරිපත් කර තිබුණි. එවකට අනුරාධපුර අලෙවිසැලෙහි කාර්යභාර නිලධාරී ලෙස කටයුතු කරන ලද සේවක මහතාට එරෙහිව විධිමත් විනය පරීක්ෂණයක් පවත්වාගෙන යයි. මීට අමතරව ණයකරුගේ බිරිඳ වන එවකට අනුරාධපුර අලෙවිසැලෙහි සේවය කළ හා ණයකරුට ලිපිද්‍රව්‍ය නිකුත් කළ එස්. සුරංජි හේවගේ මියට චෝදනා පත්‍රයක් යවා ඇත.

(ඈ) මෙම ණය අයකර ගැනීම ක්‍රමවත් සහ කඩිනම් කිරීමට නිලධාරීන් දෙදෙනෙකු පූර්ණ කාලීනව යොදවා එම කටයුත්ත ගණකාධිකාරීවරයෙකුගේ අධීක්ෂණය යටතේ දැනට කරගෙන යනු ලැබේ.

(ඉ) ජාතික කඩදාසි සංස්ථාව අපගේ ණයගැතියෙකු මෙන්ම ණයහිමියකු ද වේ. ණයගැති ශේෂය රු. 9,753,427.27 කි. අපගේ ණයහිමි ශේෂය රු. 7,460,675.01කි. අප විසින් අස්කොන් කඩදාසි සැපයීම සහ ඒ වෙනුවෙන් ෆයිල් කවර මිලදී ගැනීම වර්ෂ කිහිපයක සිට සිදුකරනු ලබයි. ඒ අනුව ණයගැති ශේෂය රු. 2,292,752.26 කි.

(ඊ) ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයෙන් අයවිය යුතු ශේෂය අයකර ගැනීම සඳහා අපගේ විගණන අංශයේ විගණන නිලධාරී විශේෂ ප්‍රයත්නයක් දැරූ අතර, ඉන් රු. 8,404,393.56 මුදලක් 2015.01.02 දින අයකර ඇත. ඉතිරිය වූ රු. 10,226,784 අයකර ගත නොහැකි තත්ත්වයක පවතී. 2015 මාර්තු මස අවසාන ගිණුම් පරීක්ෂාවේ දී විගණකවරුන් මේ පිළිබඳ අවධානය යොමු කර නොමැත.

(උ) වසර 2-5 අතර බේරුම් නොකරන ලද ණයහිමියන් වෙත ලිපි යවා ඔවුන්ගෙන් ප්‍රතිචාරයක් නොමැති නම් මෙම ශේෂයන් ඉදිරි වසර තුළදී ආදායමට ලියා හැරීමට පියවර ගනු ලැබේ.

(ඌ) දේශීය ආදායම් දෙපාර්තමේන්තුව වෙත රුපියල් මිලියන 54.5ක මුදලක් 2015.06.19 දින වන විට ගෙවා ඇත. ඒ අනුව හිඟ ශේෂය රු. 72,813,671 - 54,467,000 රු. 18,346,671/= ඉදිරියේ දී මෙය පියවා දැමීමට සැලසුම් කර තිබුණි. මෙම වාර්තාව මුද්‍රණය කරන විට පසුගිය වර්ෂයට අදාළව (2013-2014) ආදායම් බදු සඳහා ගෙවීම් මේ වන විට ගෙවා අවසන් කර ඇත.

## 2.4 නීතිරීති රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

(අ) 2006 අංක 10 දරන දේශීය ආදායම් පනතේ 153,155 සහ 160 වගන්ති යටතේ දේශීය ආදායම් දෙපාර්තමේන්තුව විසින් පනවා තිබූ රඳවා තබා ගැනීමේ බදු **(Withholding Tax)** බලාත්මක වූ කාලයේදී, ගනුදෙනුකරුවන් විසින් සෘජුවම මෙම බද්ද සංස්ථාව වෙනුවෙන් ගෙවීම නිසා, රුපියල් මිලියන 25කට අධික මුදලක් 2010 වසර වන විට දේශීය ආදායම් දෙපාර්තමේන්තුවට වැඩිපුර ගෙවා තිබුණි. මේ පිළිබඳව සමතයකට පත්කර ගන්නා තෙක් අනෙකුත් බදු මුදල් නොකඩවා ගෙවීමෙන් සංස්ථාවේ ද්‍රවශීලතාවයට අහිතකරව බලපාන බැවින්, අදාළ මුදල් රඳවා ගැනීමට එවකට පැවති කළමනාකාරීත්වය තීරණය කරන ලදී.

(ආ) ජාතිය ගොඩනැගීමේ බදු ද සංස්ථාවේ රඳවා ගන්නා ලද අතර, එකතු කළ අගය මත බදු සහ ජාතිය ගොඩනැගීමේ බදුවලට අදාළ බදු වාර්තා **(Tax returns)** පමණක් දේශීය ආදායම් දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කරන ලදී. ජාතිය ගොඩනැගීමේ බදු වියදම ගණනයේ දී සංස්ථාව විසින් දැරිය යුතු වියදම ගණනය කොට දේශීය ආදායම් දෙපාර්තමේන්තුව වෙත ප්‍රේෂණය කරනු ලැබේ. එහෙත් ජාතිය ගොඩනැගීමේ බදු ගිණුම්ගත කිරීමේ දී සත්‍ය වශයෙන් ම ඒ සඳහා අප වැය කළ මුදල එනම් ගනුදෙනුකරුවන්ගෙන් යම් කොටසක් අයකර ගෙන ඇත්නම් එය අඩුකොට ආයතනය දැරූ වියදම පමණක් ගිණුම්ගත කරනු ලැබේ.

(ඇ) ගොනු අංක **SPC/SU/2013/I/41** යටතේ ප්‍රසිද්ධ පුවත්පත් දැන්වීමක් තුළින් ටෙන්ඩර් කැඳවන ලද අතර එම කඩදාසි 2014 වසර තුළ අපේක්ෂිත වාර්ෂික මුද්‍රණ ඇණවුම් සඳහාත්, විශේෂයෙන් ලොතරැයිපත් මුද්‍රණය සඳහා කඩදාසි තොග පවත්වා ගැනීම සඳහාත්, ජන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවේ මුද්‍රණ කටයුත්තක් සඳහාත් ඇණවුම් කරන ලදී. මේ සඳහා ලංසුකරුවන් 04 දෙනෙකු ඉදිරිපත් වී තිබූ අතර, ස්ටෑන්ඩර්ඩ් ට්‍රස්ට් (ප්‍රයිවට්) ලිමිටඩ් ආයතනය ද ලංසු ඉදිරිපත් කර තිබුණි. මෙය රජයේ ලියාපදිංචි කර තිබූ ආයතනයක් ලෙස තහවුරු වූ නිසා අදාළ කටයුතු සිදුකර ඇත. කෙසේ වෙතත් විගණකාධිපති දෙපාර්තමේන්තුවේ පෙන්වාදීම අනුව මින් ඉදිරියට මෙම ආයතනය සමඟ ගනුදෙනු කිරීම නතර කර ඇත.

(ඈ) **Hyundai Lanka (Pvt) Ltd.** ආයතනය විසින් 2015.04.20 වන දින රු. 615,000/=ක මුදලක් ගෙවා ඇත. ඉතිරි මුදල ලබා ගැනීම සඳහා ඉදිරි කටයුතු කරනු ලැබේ.

(ඉ) මේ යටතේ දක්වා ඇති නිල වාහන සභාපති, උප සභාපති, සාමාන්‍යාධිකාරී හා ආයතන කළමනාකරු විසින් භාවිතා කර ඇත. දැනට උප සභාපති හා ආයතන කළමනාකරු අදාළ තනතුරු වලින් ඉවත් වී ඇත. අප ආයතනය තරඟකාරී ලෙස ටෙන්ඩර්වලට සහභාගි වී මුද්‍රණ කටයුතු ලබාගෙන හා පාසල් පෙළ පොත් මුද්‍රණ කටයුතු වැනි රජයේ මුද්‍රණ කටයුතු වලින් ලැබෙන ආදායම් මත පවත්වාගෙන යන ආයතනයක් බැවින් රාජකාරී කටයුතු සඳහා නොයෙකුත් ආයතනයන් වෙත යෑමට සිදුවේ. එමෙන්ම කොළඹින් පිටත පිහිටා ඇති ආයතනයක් බැවින් රාජකාරී කටයුතු සඳහා ගමන් කිරීමේ දී වැඩිපුර ඉන්ධන වැයවීමක් සිදුවේ. තවද වෙනත් රාජ්‍ය ආයතනවල පැවැත්වෙන උත්සව සහ සාකච්ඡා සඳහා සහභාගිවීම සඳහාත්, දිවයින පුරා පිහිටා ඇති අලෙවිසැල් නිරීක්ෂණ චාරිකාවලට සහභාගිවීමට සිදුවන නිසාත්, දී ඇති සීමාව තුළ ඉන්ධන භාවිතා කිරීම ඉතා අපහසු කාර්යයක්ව පවතී.

(ඊ) **KV- 6712** වාහනය සභාපතිතුමාගේ රාජකාරී අවශ්‍යතා සඳහා භාවිතා කළ අතර, **JV - 1155** සහ **250 - 0846** දරන වාහන අලෙවි ප්‍රවර්ධන කටයුතු සඳහාත් යම් යම් අවස්ථාවලදී සභාපතිතුමාගේ රාජකාරී කටයුතු සඳහාත් භාවිතා කර ඇත.

## 2.5 මතභේදයට තුඩුදෙන ගනුදෙනු

(අ) එවකට සිටි සභාපතිගේ උපදෙස් පරිදි කුලියාපිටිය පැවති දැයට කිරුළ ප්‍රදර්ශනයෙහි **SPC** ප්‍රදර්ශන කුටිය ඉතා උසස් නිමාවකින් සැකසීමට සැලසුම් කර ඇත. එහිදී එය ගෝතික් හෝල්ඩින්ස් ආයතනයට පවරා ඇති අතර, කුටිය සෑදීම සඳහා පහත පරිදි වියදම් ගොස් ඇත.

| විෂය | විස්තරය | ඇණවුම් කළ ප්‍රමාණය | මිල රු. ශත |
|---|---|---|---|
| 20" × 15" දැයට කිරුළ ප්‍රදර්ශන කුටිය - 2014 | | | |
| 1. | එම්ඩීඑෆ් බෝර්ඩ්, උසස් ඝනයේ ඩිජිටල් ස්ටිකර් සහ ප්‍රදර්ශන පොත් රාක්ක, කාපට්, විදුලි ආලෝකය හා අවශ්‍ය සියලුම නිමි භාණ්ඩ යොදා ප්‍රදර්ශන කුටිය නිම කිරීමේ වියදම | | 1,635,000.00 |
| 2. | සැලසුම් කිරීම හා නිර්මාණය කිරීම | | 150,000.00 |
| 3. | ගමනාගමන වියදම් | 65,000.00 | |
| 4. | සවිකිරීමේ වියදම් | | 15,000.00 |
| | | | 1,865,000.00 |
| | | 2% NBT | 37,300.00 |
| | | 12% VAT | 228,276.00 |
| | එකතුව | | 2,130,576.00 |

(ආ) එවකට පැවති ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත සියල්ල අවලංගු කොට 2012 වසරේ සිට නව ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන් **(LKAS)** සහ මූල්‍ය වාර්තාකරණ ප්‍රමිතීන් හඳුන්වා දෙනු ලැබීය. ඒවා එක්වරම අනුගමනය කිරීමේ දී විවිධ දුෂ්කරතාවයන්ට මුහුණ දීමට සිදුවිය. 2012 වසර වෙනුවෙන් ගිණුම් පිළියෙල කර ඉදිරිපත් කරන ලද නමුදු සංස්ථා ඉතිහාසයේ ප්‍රථම වතාවට විගණකාධිපති වාර්තාවේ අහිතකර මතයක් ඉදිරිපත් කර තිබුණි. අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මෙම තත්ත්වය සලකා බලා 2014.01.29 වන දින

පැවති 743 වන අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේ දී තීරණයක් ගනිමින් වෘත්තියේ යෙදී සිටින වරලත් ගණකාධිකාරී සමාගමකින් උපදේශක සේවාවක් ලබාගෙන 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා අදාළ ප්‍රමිතියන්ට අනුව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සඳහා අනුමැතිය ලබාදෙන ලදී. ඒ අනුව අදාළ වරලත් ගණකාධිකාරී සමාගමේ උපදෙස් පරිදි 2013 වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන පිළියෙල කරනු ලැබූ අතර, ඒ සඳහා යොදවා ගන්නා ලද්දේ මුදල් අංශයේ කාර්ය මණ්ඩලය පමණි.

විගණන වාර්තාවේ මුදල් අංශයට අයත් කාර්ය මණ්ඩලයේ සංයුතිය ලෙස සලකා ඇත්තේ වැටුප් පිළියෙල කිරීමේ සාරාංශ පත්‍රිකාව අනුව මුදල්, සැපයුම් සහ අභ්‍යන්තර විගණන යන අංශ 3ම එකක් වශයෙන් සලකා ගණනය කිරීමෙනි. මුදල් අංශයේ මේ වන විට සමස්ථ කාර්ය මණ්ඩලය 31ක් පමණක් වන බැවින් 50 දෙනෙකුට අධික කාර්ය මණ්ඩලයක් ගිණුම් අංශයේ සේවයේ නිරතව සිටින බවට කර ඇති ප්‍රකාශය සාවද්‍යය.

(ඇ) 2006 අංක 10 දරන දේශීය ආදායම් පනතේ 116 වන වගන්තිය යටතේ 1997 සිට බලපැවැත්වූ උපයන විට ගෙවීම සම්බන්ධයෙන් එකී පනතේ 114 වන වගන්තියට අනුව ඉදිරිපත් කර තිබූ බදු වක්‍ර අංක 6 (බදු මත බදු අනුප්‍රමාණ) යොදා ගෙවීම් කටයුතු සිදුකරන මෙන් දේශීය ආදායම් දෙපාර්තමේන්තුවෙන් උපදෙස් දෙන ලදී. ඉන්පසු වාර්ෂික රාජ්‍ය අයවැය ලේඛනයක් මගින් සිදුකරනු ලබන සංශෝධනයන්ට ද අනුගත වෙමින් වසර 19ක් මුළුල්ලේ බදු වක්‍ර අංක 6 අදාළ කර ගනිමින් නොකඩවා උපයන විට බදු ගෙවීම් සිදුකොට ඇත.

මේ සම්බන්ධයෙන් 2015.05.21 දින පැවති 756 වැනි අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේ දී දීර්ඝ ලෙස සාකච්ඡා කිරීමෙන් පසුව මේ පිළිබඳ දේශීය ආදායම් දෙපාර්තමේන්තුවෙන් නිවැරදිතාවය තහවුරු කර ගන්නා මෙන් උපදෙස් දෙන ලදී. ඒ අනුව 2015.06.05 වන දින මුදල් කළමනාකරු අදාළ කොමසාරිස්වරිය හමුවී ලිපියක් ඉදිරිපත් කරන ලදී. (එහි පිටපතක් මෙයට අමුණා ඇත.) මෙය නිවැරදි බව කොමසාරිස්වරිය වාචිකව දන්වා ඇති අතර, මේ සම්බන්ධයෙන් ලිඛිත පිළිතුරු උපයන විට බදු ගෙවීම පිළිබඳව බදු විගණනයක් **(Tax Audit)** සිදු කිරීමෙන් අනතුරුව ලබාදෙන බවද වැඩිදුරටත් දන්වා ඇත.

කෙසේ වෙතත් 2016 වසරේ ජූනි මස සිට අදාළ බද්ද සේවකයන්ගෙන් අඩුකර ගෙවීමට කටයුතු කර ඇත.

## 3. මූල්‍ය සමාලෝචනය

### 3.1 මූල්‍ය ප්‍රතිඵල

මේ සම්බන්ධයෙන් වැඩි අවධානයකින් කටයුතු කිරීමට සැලසුම් කර ඇත.

### 3.2 ණය උපයෝජනය

වාර්ෂිකව පිරිවැටුම වර්ධනය කර ගැනීමේ දී නිෂ්පාදනය සහ තොග මට්ටම් පවත්වා ගැනීම වෙනුවෙන් වැඩි අමුද්‍රව්‍ය ප්‍රමාණයක් සපයා ගැනීමට සිදුවේ. මේ සඳහා වෙනත් කිසිදු අතිරේක අරමුදල් සම්පාදනයක් නොවන බැවින්, කෙටි කාලීන බැංකු ණය ලබා ගැනීම හැරුණු විට වෙනත් විකල්පයක් නොමැත.

අපගේ ප්‍රධාන ගනුදෙනුකරු වන අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලබන ඉන්වොයිස්පත් ඒ ඒ අවස්ථාවේදීම නිරවුල් කරනු ලබන්නේ නම් අදාළ කෙටි කාලීන ණය නියමිත දිනයේ දී ගෙවිය හැකි වේ. එහෙත් වසර අවසාන භාගයේ දී නිකුත් කරනු ලබන ඉන්වොයිස්පත් නිරවුල් කිරීම සිදුවන්නේ ඉන් පසුව එළඹෙන වසරේ අප්‍රේල්, මැයි මාසවලදී බැවින්, අදාළ කෙටි කාලීන ණය වර්ෂාවසානයේ හිඟව පවතී.

එමෙන්ම අභ්‍යාස පොත් නිෂ්පාදනය වෙනුවෙන් ලබාගත් කෙටි කාලීන ණය මුදල් ද පියවා අවසන් කළ නොහැකි වන්නේ අභ්‍යාස පොත් අලෙවියෙන් 80%කට වැඩි ප්‍රමාණයක් ණය පදනම මත සිදු කරනු ලබන බැවින්, වසර අවසාන දිනය වන විට අදාළ මුදල් හිඟව පවතින බැවිනි. මේ නිසා 2014 දෙසැම්බර් 31 දින වන විට හිඟව පවතින කෙටි කාලීන ණය ප්‍රමාණය රු. 494,970,217ක් ලෙස උපරිම අගයක් ගෙන ඇත.

### 3.3 කාරක ප්‍රාග්ධන කළමනාකරණය

(අ) කාරක ප්‍රාග්ධනය වර්ධනය කර ගැනීමටත් වාර්ෂික ආදායම වර්ධනය කර ගැනීමටත් අලෙවි අංශය කාර්යක්ෂමව හා ඵලදායී ලෙස යොදා ගැනීමට සැලසුම් කර ඇත.

(ආ) කාර්යක්ෂමව ණය අයකර ගැනීම තුළින් ද්‍රවශීලතාවය වර්ධනය කර ගැනීම සඳහා වෙනම ගණකාධිකාරීවරයෙකු යටතේ කාර්ය මණ්ඩලය පත් කර ඇත.

## 4. මෙහෙයුම් සමාලෝචනය

### 4.1 කළමනාකරණ අකාර්යක්ෂමතාව

වර්ෂ අවසානයේ දී කෙටි කාලීන ණය මුදල් ශේෂය වැඩි වී තිබුණේ කාලීනව අවශ්‍ය නොවන හා සෙමින් චලනය වන තොගවල මුදල් ආයෝජනය කිරීම නිසා නොව වර්ෂය අවසාන කාර්තුවේ දී පාසල් පෙළ පොත් හා පාසල් අභ්‍යාස පොත් සඳහා නිෂ්පාදනයට බාධාකාරී නොවන පරිදි අමුද්‍රව්‍ය ආනයනය කිරීමට සිදු වූ නිසාවෙනි. නිෂ්පාදනයෙන් වැඩි කොටසක් ණයට විකුණුම් මත සිදුවන බැවින්, ගිණුම් වර්ෂය අවසන් දිනට කෙටි කාලීන ණය ශේෂය පියවා ගැනීමට නොහැකි වනු ඇත.

### 4.2 මෙහෙයුම් කාර්යක්ෂමතා

(අ) 2014 වර්ෂය සඳහා අලෙවිසැල් මට්ටමින් බෙදා වෙන් කරන ලද අලෙවි වටිනාකම් ඉලක්කයන් සකසා තිබූ අතර, 'නිෂ්පාදන සැලසුම් - 2014' මැයෙන් 2014 වර්ෂයේ දී විකිණීමට අපේක්ෂිත සංස්ථා අභ්‍යාස පොත් හා ලිපිද්‍රව්‍යවල විශ්ලේෂණාත්මක වාර්තාවක් කළමනාකරු (ලිපිද්‍රව්‍ය කම්හල) වෙත ලබා දී ඇත. 2015 හා 2016 සඳහා සමස්ථ අලෙවි සැලැස්මක් සකස් කර ඒ අනුව කටයුතු කරනු ලැබේ.

(ආ) මින් ඉදිරියට එවැනි තත්ත්වයක් ඇති නොවීමට කටයුතු කරනු ලැබේ.

(ඇ) නාගරික සංවර්ධන අධිකාරියෙන් කරන ලද ඉල්ලීමකට අනුව කැබිනට් මණ්ඩලයේ අනුමැතිය ලබා ගැනීමෙන් අනතුරුව ඩී. එම්. කොළඹගේ මාවතේ පර්චස් 27ක ඉඩම අප වෙත පවරා දීමට හැකි බව දන්වූ අතර, එම පවරා දීම සඳහා රු. 25,714,080/=ක වටිනාකමට බදු පදනම මත ලබා ගැනීම සඳහා එහි සැකසුම් ගාස්තු වශයෙන් රු. 1,000,000/=ක මුදලක් අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය ඇතිව ගෙවීමට කටයුතු කරන ලදී. ඉදිරි කටයුතු කරගෙන යාම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය දැනුවත් කළ විට මිලදී ගැනීම සම්බන්ධයෙන් රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ උපදෙස් ලබාගන්නා ලෙස දන්වන ලදී. ඒ අනුව මෙය ඵලදායී ආයෝජනයක් නොවන බවත්, ඒ සඳහා මූල්‍යමය ශක්‍යතාවය අධ්‍යයනය කර වාර්තාවක් ඉදිරිපත් කරන ලෙස දන්වන ලදී. හිටපු සභාපති හීන්කෙන්ද මහතාගේ ඉල්ලා අස්වීමෙන් පසු පැමිණි සභාපති දසනායක මහතා මෙහි අවශ්‍යතාවයක් නොමැති බව දන්වමින් අධ්‍යක්ෂ මණ්ඩලය දැනුවත් කළ අතර, ඉන්පසු එහි ඉදිරි කටයුතු කිරීම නවතා දමන ලදී. අවශ්‍යතාවය පදනම් කරගෙන මිලදී ගැනීම සඳහා අවශ්‍ය කටයුතු සිදු කර ඇති අතර, ශක්‍යතා අධ්‍යයනයක් සිදු කර නොමැත.

(ඈ) 2014 නිෂ්පාදන සැලැස්මට අනුව මුද්‍රණය සඳහා අප විසින් අපේක්ෂිත පොත් ප්‍රමාණය මිලියන 9.13ක් වූ නමුත් අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව විසින් අප වෙත ලබාදුන් ප්‍රමාණය මිලියන 8.41කි. එබැවින් අපේක්ෂිත ප්‍රමාණයට වඩා මිලියන 0.72ක අඩුවීමක් ඇත.

කලින් අපේක්ෂා කළ වටිනාකම රු. මි. 730 වුවද වෙළඳපොළේ කඩදාසි මිල වැඩිවීම හා වැටුප් වැඩිවීම හේතුවෙන් සේවකයින්ගේ ගෙවීම් ප්‍රමාණය වැඩිවීමද වැඩි නිෂ්පාදන ධාරිතාවක් ලබා ගැනීම සඳහා අතිකාල හා කෑලි ගණනට සිදු කරන ගෙවීම් වැඩි කිරීම යනාදී කරුණු නිසා නිෂ්පාදන පිරිවැයේ වැඩිවීමක් සිදුවී ඇත.

(ඉ) මෙම ප්‍රමාද ගාස්තු වැඩිවීමට හේතුව එම කාල සීමාව තුළ මෙම පොත් මුද්‍රණය කරන ලද යන්ත්‍රවල ලොතරැයිපත් ද මුද්‍රණය කිරීමට සිදුවීමය. ඉදිරියේ දී මෙම ප්‍රමාද ගාස්තු අවම වන ආකාරයට නිෂ්පාදන ක්‍රියාවලිය සිදුකිරීමට සැලසුම් කර ඇත. තවද ලොතරැයිපත් ආදිය මුද්‍රණයට නව මුද්‍රණ යන්ත්‍රයක් මිලදී ගැනීමට අවශ්‍ය කටයුතු කරමින් පවතී.

### 4.3 නිශ්ක්‍රිය හා ඌන උපයෝජිත වත්කම්

තොග වටිනාකම් තුළ ඇතුළත් හානි වූ සෙමින් චලනය වන හා චලනය නොවන තොග අයිතම් වාර්ෂිකව කමිටුවක් මගින් තොග පත්වලින් ඉවත් කිරීමට කටයුතු කරනු ලබයි. බොහෝ විට හානි වූ තොග, කමිටුවක් මගින් ඉවත් කිරීමට නිර්දේශ කළ ද චලනය නොවන හා සෙමින් චලනය වන තොග සංස්ථාවේ අනාගත පරිහරණය සඳහා අවශ්‍යයැයි අදහස් කරන්නේ නම් තොග පත්වලින් ඉවත් කිරීමට කටයුතු නොකරනු ඇත. මෙම වාර්තාව මුද්‍රණය කරන අවස්ථාව වන විටද ප්‍රධාන ගබඩාව විසින් හඳුනාගෙන ඇති ඉහත වර්ගයේ තොග ලැයිස්තුවක් කළමනාකාරිත්වය වෙත ඉදිරිපත් කර අපහරණ කමිටුව වෙත ඉදිරිපත් කිරීමට කටයුතු යොදා ඇත.

### 4.4 කොන්ත්‍රාත් පරිපාලනයේ අඩුපාඩු

(අ) (ආ) මූලික අවශ්‍යතාවය හඳුනා ගැනීම හා භාණ්ඩ සහිතව ඉල්ලුම් කිරීමේ දී පැවති අඩුපාඩු මත ඉහත සිදුවීම සිදුවී ඇත. ප්‍රසිද්ධ පුවත්පත් දැන්වීම මත ලංසු කැඳවනු ලැබූ අතර, නියමිත වේලාවට ලැබී තිබුණේ එක් ලංසුවක් පමණි. ප්‍රමාද වී පැමිණි ලංසු ප්‍රසම්පාදන රෙගුලාසි 6.3.2 යටතේ ප්‍රතික්ෂේප කරන ලද එකම ලංසුව ඇගයීම ගෙන ඇත. ඇස්තමේන්තු සැකසීමේදී නිසි ලෙස පිරිවිතර හඳුනාගෙන කලින් ලබාගත් ඇස්තමේන්තුවක් මත ඇස්තමේන්තු සැකසීමේ දී මෙම අඩුපාඩුව සිදුවී ඇත.

කෙසේ වුව ද ජන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුවේ අවශ්‍යතාව පරිදි පෙට්ටිවල ගුණත්වය වැඩි දියුණු කර ඉතා කඩිනමින් ජාතික කටයුත්තක් ඉටු කිරීම සඳහා උපදෙස් දී තිබූ නිසා යළි යළි ලංසු කැඳවීමට කාලය නොමැති වී ඇත. ඉතාමත් කෙටි කාලයක දී එම නිෂ්පාදන කටයුතු කඩිනම් කර ජන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුවට මුද්‍රිත නිෂ්පාදන භාර දෙන ලදී.

(ඈ) ගොනු අංක SPC/SU/I/2014/10 යටතේ මෙම ටෙන්ඩරය අමාත්‍යාංශ ටෙන්ඩර් සීමාව යටතේ අමාත්‍යාංශ ටෙන්ඩර් මණ්ඩලය විසින් ප්‍රසම්පාදනය කර ඇත.

මෙහි පිරිවිතර සපුරා ඇත්තේ ලංසුකරුවන් දෙදෙනෙකු පමණක් බව (ITI) කාර්මික තාක්ෂණික ආයතනයේ වාර්තාව පෙන්වා දෙයි. ඒ අනුව තාක්ෂණික කමිටුව හා ප්‍රසම්පාදන කමිටුව සාකච්ඡා කර උපරිම ලංසුකරුගේ මිල සංශෝධනයට එකඟ කරගෙන ඇත. ඒ අනුව ටෙන්ඩර් මිල අඩුකර පිරිවිතර වඩාත් සුදුසු කඩදාසි මිලට ගෙන ඇත. මෙය තරඟකාරී අලෙවි කටයුත්තක් සඳහා යොදා ගන්නා නිසා කඩදාසිවල ගුණත්වය පිළිබඳ වැඩි තක්සේරුවක් දී ඇත.

### 4.5 වෙනත් රාජ්‍ය ආයතන වෙත ලබාදුන් සංස්ථාවේ සම්පත්

(අ) ගරු ජනමාධ්‍ය අමාත්‍යතුමාගේ ඉල්ලීමට අනුව කොන්ත්‍රාත් පදනම මත සේවකයන් 10 දෙනෙකු අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය සහිතව බඳවා ගත් අතර, සභාපතිතුමාගේ උපදෙස් පරිදි ඔවුන් අමාත්‍යාංශ සේවයට මුදා හැරීමට කටයුතු කර තිබුණි. මෙසේ අමාත්‍යාංශයට අනුයුක්ත කළ සේවකයින්ගේ රාජකාරී කටයුතු අධීක්ෂණය කරන නිලධාරීන් විසින් අතිකාල සහ අනෙක් දීමනා ගෙවීම අනුමත කර ඇති අතර, සභාපතිතුමාගේ උපදෙස් මත ගෙවීම් කටයුතු සිදුකර ඇත.

2015.01.08 වන දින සිට කොන්ත්‍රාත් පදනම මත බඳවා ගත් සේවකයින් 08 දෙනෙකු අමාත්‍යාංශ සේවයෙන් ඉවත්ව ගොස් ඇති අතර ස්ථිර පදනම මත සේවයේ යෙදී සිටි සේවකයින් 02 දෙනෙකු පමණක් නැවත සංස්ථා සේවයට වාර්තා කර ඇත. කොන්ත්‍රාත් පදනම මත සේවය කළ සේවකයින් සංස්ථා සේවයෙන් ඉවත්ව ගොස් ඇති බැවින් 2015.01.08 වන දිනෙන් පසු ඔවුන්ට වැටුප් හා දීමනා ගෙවා නොමැත.

(ආ) සංස්ථාව සතු ඉඩමෙන් අක්කර 13යි රූඩ් 02යි පර්චස් 06ක කොටස දැනට පරිහරණය කරනු ලබන කාර්මික සංවර්ධන මණ්ඩලය වෙත පැවරීමට අවශ්‍ය කටයුතු සකසමින් සිටින අතර, වර්තමාන වෙළඳපළ වටිනාකම අනුව තක්සේරු කර අප සංස්ථාවට මුදල් අයකර ගැනීමට කටයුතු යොදා ඇත.

### 4.6 කාර්ය මණ්ඩල පරිපාලනය

(අ) 2014.12.31 වන දිනට පැවති පුරප්පාඩු 108න් 80ක් පමණ වැඩ අංශයට අයත් තනතුරුවල පවතින පුරප්පාඩු වන අතර, එම බඳවා ගැනීම් පරිපාටියට අනුව එම තනතුරුවලට බඳවා ගැනීම සඳහා NVQ සුදුසුකම දක්වා ඇති බැවින්, ඒවා පිරවීමට නොහැකි වී ඇත. මේ පිළිබඳව කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවෙන් ඉල්ලීමක් කර ඇතත් විසඳුමක් ලැබී නොමැති බැවින්, ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීමේ අධිකාරිය සමඟ සාකච්ඡා කර ඉතා ඉක්මණින් මෙම ගැටළුව විසඳීමට අවශ්‍ය කටයුතු කරනු ලැබේ.

(ආ) අනියම් පදනම මත සේවය කරන සේවක මහතා ස්ථිර තනතුරකට පත්කර ඇති අතර, කොන්ත්‍රාත් සහ තාවකාලික පදනම මත බඳවාගෙන ඇති සේවකයින් එම සේවා කාලය අවසන් වූ පසු සේවා අවශ්‍යතාවයක් නොමැති නම් සහ පුරප්පාඩු නොමැති නම් සේවය අවසන් කිරීමට කටයුතු කරනු ලැබේ.

(ඇ) ආයතනයේ අවශ්‍යතාවය සඳහා මෙහෙයුම් කළමනාකාර තනතුරක් ඇති කිරීම පිණිස 2012.12.13 වන දින අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකාවක් ඉදිරිපත් කරන ලද අතර ඒ අනුව එල්. ජී. හේවාවිතාරණ මහතාට පෞද්ගලික වන සේ මෙහෙයුම් කළමනාකාර තනතුරක් ඇති කිරීමටත් ඒ සඳහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබා ගැනීමටත් අනුමත කර ඇත. 2015.05.24 වන දින එල්. ජී. හේවාවිතාරණ මහතා විශ්‍රාම ගොස් ඇති බැවින්, මෙම තනතුර අහෝසි වී ඇත. ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ නිලධාරී තනතුර එම තනතුරට පත් කළ අය සඳහා පෞද්ගලික වන අතර, දැනට එක් නිලධාරියෙකු පමණක් එම තනතුරේ සේවයේ නිරත වී සිටී.

### 4.7 වාහන උපයෝජනය

උප සභාපති වෙත ලබාදීමට සුදුසු වාහනයක් සංස්ථාවේ එම කාලසීමාවේ නොමැති වූ බැවින්, කුලී පදනම මත වාහනයක් ලබා ගෙන තිබුණි. දැනට වෙන්කළ වාහන කුලී පදනම මත ලබා නොගනී.

අලෙවි ප්‍රවර්ධන ව්‍යාපෘති සඳහා පත්කර සිටි නිලධාරීන් ඉවත්වීමෙන් අනතුරුව නැවත මෙවැනි පත් කිරීම් සිදුකර නොමැත. දැනට එවැනි වාහන හෝ ඉන්ධන දීමනා ලබා නොදේ.

**5. ගිණුම් කටයුතු භාවය සහ යහපාලනය**

**5.1 ප්‍රසම්පාදන සැලැස්ම ඵලදායී පාලන කාර්යයක් ලෙස යොදා ගැනීමට කටයුතු යොදා ඇත.**

**5.2 අයවැය ලේඛනමය පාලනය**

අයවැය ලේඛනය ඵලදායී කළමනාකරණ පාලන කාර්යයක් ලෙස යොදා ගැනීමට කටයුතු යොදනු ලැබේ.

**6. පද්ධති හා පාලනයන්**

මෙහි සඳහන් (අ) සිට (උ) දක්වා වූ පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු කිරීමට කටයුතු කරනු ලැබේ.